සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

Sabaragamuwa Provincial Department of Education

சபரகமுவ மாகாணக் கல்வி திணைக்களம்

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය -2026

තෙවන වාර පරීක්ෂණය

ඉන්දීය ඉතිහාසය II (I කොටස) இந்திய வரலாறு II (பகுதி I) History of India II (Part I)	25A S II	13 ශ්‍රේණිය தரம் 13 Grade 13

පැය තුනයි ***03***
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය -මිනිත්තු10 යි
மேலதி வாசிப்பு நேரம் -10 நிமிடங்கள்
Additional Reading Time -10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කරගැනීමටත් යොදා ගන්න.

ඉන්දියාවේ ඉතිහාසය -ඈත අතීතයේ සිට ක්‍රි.ව. 1206 දක්වා

විභාග අංකය .....

උපදෙස්-

- මෙම ප්‍රශ්න පත්‍රය I හා II ලෙස කොටස් **දෙකකින්** සමන්විත වේ.
- **I කොටසෙහි 1-40** දක්වා ප්‍රශ්න **සියල්ලටම මෙම පත්‍රයේම ලබා දී ඇති උපදෙස් පරිදි** පිළිතුරු සපයන්න.
- **I කොටසෙහි** නිවැරදි පිළිතුරක් සඳහා ලකුණු **එක** බැගින් හිමි වේ.
- කොටස් **දෙකට ම** මුළු කාලය **පැය තුනකි.** පිළිතුරු ලියා අවසන් වූ පසු, **I කොටස II කොටසේ** පිළිතුරු පත්‍රය සමඟ **අමුණා භාර දෙන්න.**

අංක **1** සිට **10** තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් **පහ** බැගින් දී ඇත.ඒවා අතුරෙන් **එකක්** පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමඟ **නො ගැලපේ .නො ගැළපෙන** නාමය කුමක්දැයි හඳුනාගෙන එහි **අංකය වරහන** තුළ ලියන්න.

1. (1) භාරතවර්ෂ (2) භාරත්දේශ (3) ජම්බුද්‍වීප
(4) හින්දුස්ථාන් (5) සප්තසින්දු (.....)

2. (1) සත්ලෙජ් (2) සොග්‍රා (3) බියස්
(4) රාවි (5) චේනාබ් (.....)

3. (1) හිල්සා ලිපිය (2) ගිර්නාර් ලිපිය (3) රුම්මින්දෙයි ලිපිය
(4) කෞෂම්හී ලිපිය (5) මස්කි ලිපිය (.....)

4. (1) හර්යංක (2) සිසුනාග (3) කුෂාණ
(4) නන්ද (5) මෞර්ය (.....)

5. (1) නාලන්දා (2) වික්‍රමශිලා (3) ජගන්දලා
(4) අවුරංගාබාද් (5) ඔදන්තපුරි (.....)

6. (1) මෘච්ඡකටිකා (2) මාලවිකාග්නිමිත්‍ර (3) දේවීචන්ද්‍රගුප්තා
(4) මේඝදූතය (5) මුද්‍රාරාක්ෂස (.....)

7. (1) ප්‍රතිහාර (2) පල්ලව (3) චේර
(4) චෝල (5) පාණ්ඩ්‍ය (.....)

Past Papers Wiki

8. (1) මහේන්ද්‍රවර්මන් (2) පරමේශ්වරවර්මන් (3) වරගුණවර්මන්
(4) ශිවස්කන්ධවර්මන් (5) නරසිංහවර්මන් (.....)

9. (1) දෙමළ (2) තෙළිඟු (3) කණ්ණඩ
(4) මලයාලම් (5) මරාඨී (.....)

10. (1) බ්‍රෝව් (2) දෙබාල් (3) තානා
(4) මුල්තාන් (5) කාංචි (.....)

- අංක **11-15** තෙක් ප්‍රශ්නවල නාම **යුගල පහ** බැගින් සපයා ඇත.එම කරුණු අතුරෙන් **එකක් අදාළ මාතෘකාවට නො ගැලපේ**. එය තෝරා ඊට අදාල **අංකය** ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.

11. (1) පාණිණි - අෂ්ටාධ්‍යායී
(2) දණ්ඩීන් - මාලවිකාග්නිමිත්‍ර
(3) පතංජලී - මහාභාෂ්‍යය
(4) අශ්වඝෝෂ - ශාරිපුත්‍රප්‍රකරණය
(5) භාස - ස්වප්නවාසවදත්තා (.....)

12. (1) රාවි - ආරවල්ලි
(2) කාවේරි - නිල්ගිරි
(3) තප්ති - සත්පුර
(4) නර්මදා - වින්ධ්‍යා
(5) තුංගභද්‍රා - බටහිර ඝාට්ස් (.....)

13. (1) කෝසල - ප්‍රසේනජිත්
(2) මගධ - අජාසත්ත
(3) ගන්ධාර - පුක්කුසාති
(4) අවන්ති - චන්ඩපජ්ජෝත
(5) වත්ස - බ්‍රහ්මදත්ත (.....)

14. (1) මධුරෙයිකොණ්ඩ - පළමුවෙනි පරන්තක
(2) අමිත්‍රඝාත - බින්දුසාර
(3) කවිරාජ් - සමුද්‍රගුප්ත
(4) සකලඋත්තරාපතනාථ - කණිෂ්ක
(5) වාතාපිකොණ්ඩ - නරසිංහවර්මන් (.....)

15. (1) පාටලීපුත්‍ර - පැටිනා
(2) සෞරාෂ්ට - මහාරාෂ්ට
(3) ඉන්ද්‍රප්‍රස්ථ - දිල්ලිය
(4) ප්‍රයාග - අලහබාද්
(5) පුරුෂපුරය - පෙෂාවෝර් (.....)

- අංක **16** සිට **20** තෙක් එක් එක් ප්‍රශ්නයෙහි නාම/ප්‍රකාශන/දින වකවානු සමූහයක් **X** හා **Y** තීරවල දී ඇත. **Y** තීරයේ දී ඇති නාම/ ප්‍රකාශන/දින වකවානු **X** තීරයේ දී ඇති ඒවා සමග කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට **නොවේ**. **X** තීරය **Y** තීරය සමග ගැළපෙන අනුපිළිවෙළට සකස් කළ විට පහත ඇති සංයෝග පහෙන් **එකක්** නිවැරදිය. නිවැරදි සංයෝගයට අයත් **අංකය** තෝරා **වරහන තුළ** ලියන්න.

16

X	**Y**
(i) මිහිරකුල	A රාෂ්ටකූට
(ii) ඩිමෙට්‍රියස්	B ශක
(iii) නහපාන	C සාතවාහන
(iv) සීමුක	D හූණ
(v) දන්තිදුර්ග	E ඉන්දුග්‍රීක

(1) A E B C D (2) B C D E A (3) D A E B C (4) D E B C A (5) E B C B A (.....)

17

X	**Y**
(i) හත්ථිගුම්බා	A රුද්‍රදාමන්
(ii) ජුනාගාධ	B සමුද්‍රගුප්ත
(iii) අයිහෝලේ	C බාරවේල
(iv) අලහබාද්	D දෙවැනි පුලකේෂින්
(v) නාසික්	E ගෞතමී බාල ශ්‍රී

(1) A B D C E (2) B C D E A (3) C A D B E (4) C D E B A (5) D E B A C (.....)

18

X	**Y**
(i) උග්‍ර	A පොලිස් නිලධාරී
(ii) පාලාගල	B වඩුවා
(iii) තක්ෂන්	C භාණ්ඩාගාරික
(iv) සංග්‍රහීතෘ	D දූතයා
(v) අක්ෂවාපි	E සුදුපාලක

(1) A D B C E (2) C A E B D (3) D C B A E (4) D B C A E (5) E A B D C (.....)

19.

X	**Y**
(i) එල්ලෝරා හි කෛලාසනාථ දේවාලය	A රාෂ්ටකූට
(ii) බෙලූර් හි වෙන්නකේශව දේවාලය	B චෝල
(iii) මහාබලිපුරම් හි වෙරළේ දේවාලය	C චාලුක්‍ය
(iv) තංජෝරයේ බෘහදීෂ්වර දේවාලය	D හොයිසල
(v) බදාමියේ විෂ්ණු දේවාලය	E පල්ලව

(1) A C B D E (2) A D E B C (3) C D E B A (4) E B C D A (5) E C D A B (.....)

20.

X	**Y**
(i) ව්‍යාඝ්‍රරාජ	A ඒරණ්ඩපල්ල
(ii) දමන	B කෞරාලය
(iii) නීලරාජ	C මහාකාන්තාරය
(iv) මන්ඨරාජ	D අවමුක්තය
(v) උග්‍රසේන	E පල්ලක්කය

(1) A B D C E (2) C A D B E (3) C B A D E (4) C E D BE (5) E C D B A (.....)

- අංක **21** සිට **25** තෙක් සෑම ප්‍රශ්නයකට ම එක් මාතෘකාවක් යටතේ කරුණු **පහ** බැගින් සපයා ඇත. එම කරුණු අතුරින් **එකක් අදාළ මාතෘකාවට නො ගැළපේ**.එය තෝරා ඊට අදාළ **අංකය** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

21.**ජෛනාගම**
(1) වෘත නමින් හැඳින් වූ ශික්ෂාපද පහක් ජෛනයන් විසින් අනුගමනය කර ඇත.
(2) ජෛනාගමේ විසිහතරවැනි තීර්තංකර මහාවීර තුමාය.
(3) භාවනාව අවශ්‍යයෙන් ම ප්‍රගුණ කළ යුතු බව ජෛනයන් විශ්වාස කළහ.
(4) දිගම්බර හා ශ්වේතාම්බර නමින් කණ්ඩායම් දෙකක් ජෛනයන් අතර දැකිය හැකි ය.
(5) ඔවුහු බිලි පූජාවට ප්‍රමුඛත්වයක් දුන්හ. (.....)

22.සෘග් වෛදික යුගය
(1) සංචාරක දිවිපෙවෙතක සිට ස්ථීර පදිංචිය සහිත කෘෂි ජීවිතය කරා සංක්‍රාන්ති සමයක් වීම.
(2) මාතෘ මූලික සමාජ ක්‍රමයක් පැවතීම.
(3) පවුල් සමූහයක් එකතු වීමෙන් ග්‍රාමයක් සකස් වීම.
(4) රාජන් නැමැති නායකයකු යටතේ ගෝත්‍රය පැවතීම.
(5) පවුලේ ප්‍රධානියාගේ මූලිකත්වයෙන් නිවස තුළ ගිනි දල්වා ආගමික කටයුතු සිදු කිරීම. (.....)

23. මෞර්ය අධිරාජ්‍යයේ පරිහානියට හා බිඳ වැටීමට හේතු
(1) අසෝකගේ ආගමික ප්‍රතිපත්තියට එරෙහිව නැගුණු බ්‍රාහ්මණ විරෝධය
(2) අසෝකගෙන් පසු දුර්වල පාලකයන් බලයට පත් වීම
(3) ප්‍රාදේශීය හා දේශසීමාබද පාලකයන් බලවත් වීම
(4) ශකවරුන්ගේ ආක්‍රමණ
(5) ආර්ථික පරිහානිය (.....)

24.පාල රාජවංසය
(1) පාල රාජවංසයේ ආරම්භකයා ලෙස සැලකෙන්නේ විජයාලය රජු ය.
(2) ධර්මපාල රජු මෙම වංසයේ ශ්‍රේෂ්ඨතමයා ලෙස සැලකේ.
(3) පාලවරු බුදුදහමට අනුග්‍රහය දැක්වූහ.
(4) වික්‍රමශීලා විශ්ව විද්‍යාලය පිහිටුවන ලද්දේ ධර්මපාල රජුය.
(5) නාලන්දා තඹපත පාල රජෙකු විසින් නිකුත් කර ඇත. (.....)

25. හර්ෂවර්ධන රජතුමාගේ යුධ කටයුතු
(1) වලභි හා ගුර්ජර පාලකයන් සමග සටන් කිරීම.
(2) නැගෙනහිර ඉන්දියාවේ අවුද්,කොංගෝදා රාජ්‍ය සමග සටන් කිරීම.
(3) දෙවැනි පුලකේශීන් පරාජය කර වාලුක්‍ය දේශය යටත් කර ගැනීම.
(4) සින්ද් ප්‍රදේශය සමග සටන් කිරීම.
(5) කනෞජය මුල්කරගෙන යුධ කටයුතු මෙහෙය වීම. (.....)

- අංක **26** සිට **30** තෙක් එක් එක් ප්‍රශ්නයට දක්වා ඇති **(A) ,(B), (C)** හා **(D)**යන ප්‍රතිචාර හතර අතුරෙන් **එකක් හෝ කිහිපයක්** හෝ නිවැරදි ය.නිවැරදි ප්‍රතිචාර හෝ ප්‍රතිචාරය හෝ තෝරා,

  (A) සහ **(B)** පමණක් නිවැරදි නම්..... 1 ද

  (A) සහ **(C)** පමණක් නිවැරදි නම්..... 2 ද

  (B) සහ **(C)** පමණක් නිවැරදි නම් .....3 ද

  (C) සහ **(D)** පමණක් නිවැරදි නම් ..... 4 ද

  වෙනත් ප්‍රතිචාර සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් නිවැරදි නම්..... . 5 ද **වරහන තුළ** ලියන්න.

උපදෙස් සම්පිණ්ඩනය				
1	2	3	4	5
(A) සහ **(B)** පමණක් නිවැරදි ය	**(A)** සහ **(C)** පමණක් නිවැරදි ය	**(B)** සහ **(C)** පමණක් නිවැරදි ය	**(C)** සහ **(D)** පමණක් නිවැරදිය	**වෙනත් ප්‍රතිචාර** සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් නිවැරදි ය.

26. ඉන්දියා ඉතිහාසය හැදෑරීමට යොදාගත හැකි පුරාණ ග්‍රන්ථ සම්බන්ධයෙන් පහත කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද ?

(A) ඉන්දීය ඉතිහාසය හැදෑරීමට ඇති පැරණිතම මූලාශ්‍ර පුරාණ ග්‍රන්ථ වේ.
(B) පුරාණ ග්‍රන්ථ 18ක් පිළිබඳව සඳහන් වේ.
(C) උතුරු ඉන්දියානු රාජවංස පිළිබඳව සුළු දැනුමක් මෙමගින් ලැබිය හැකි ය.
(D) මිත්‍යා කල්පිත මේවායේ දක්නට නැත. (.....)

27. ක්‍රි.පූ.හයවන සියවසේදී උතුරු ඉන්දියාවේ පැවැති සමූහාණ්ඩු සම්බන්ධයෙන් පහත කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද ?
(A) ගණ හා සංඝ යන නම්වලින් ද මේවා හඳුන්වා ඇත.
(B) නර්මදා නදියෙන් දකුණේ පිහිටි එකම සමූහාණ්ඩුව මල්ල ජනපදය යි.
(C) ගණ රාජ්‍ය නවයක් පැවති බව බෞද්ධ සාහිත්‍ය යේ දැක් වේ.
(D) සමූහාණ්ඩු පාලකයන්ගේ ප්‍රතිපත්ති බුදුන් වහන්සේගේ විවේචනයට ලක් ව ඇත. (.....)

28. චෝල පරිපාලනය සම්බන්ධයෙන් පහත කවර ප්‍රකාශය/ ප්‍රකාශ නිවැරදි වේ ද ?
(A) අධිරාජ්‍යය මුල්කරගත් පාලන ක්‍රමයක් පැවතුණි.
(B) රජුට පාලනයේ දී සහාය වූයේ මන්ත්‍රී පර්ෂදය නම් උපදේශක සභාව යි.
(C) රාජධානියේ ඇතැම් පෙදෙස් පාලනය කරන ලද්දේ චෝල රජුගේ ආධිපත්‍යය පිළිගත් යටත් පාලකයෝය.
(D) ශිව භක්තිකයන් වූ චෝලයෝ තම රාජ්‍ය තුළ වෙනත් ආගම් ඇදහීමට ඉඩ නොදුන්හ. (.....)

29. බිම්බිසාර රජු සම්බන්ධයෙන් පහත කවර ප්‍රකාශය/ ප්‍රකාශ නිවැරදි වේ ද ?
(A) බිම්බිසාර රජු පාටලීපුත්‍ර නගරයේ සිට මගධය පාලනය කළේය.
(B) බිම්බිසාර රජු හර්යංක පෙළපතට අයත් වේ.
(C) ඔහු සේනිය යන විරුදයෙන් ද හඳුන්වා ඇත.
(D) ඔහු තම රාජ්‍ය බලය වර්ධනය කරගැනීමට විවිධ උපායන් අනුගමනය කර ඇත. (.....)

30. හියුං-සාං හිමියන් සම්බන්ධයෙන් පහත කවර ප්‍රකාශය/ ප්‍රකාශ නිවැරදි වේද ?
(A) හියුං- සාං ජපන් ජාතික සංචාරක භික්ෂුවකි.
(B) එම හිමියන් තක්ෂිලා විශ්ව විද්‍යාලයෙන් අධ්‍යාපනය ලබා ඇත.
(C) හියුං- සාං හිමි හර්ෂවර්ධන රජු අවධියේ ඉන්දියාවට පැමිණ, කනෞජ්හි පැවැති බෞද්ධ සම්මේලනයකට සහභාගී විය.
(D) උන්වහන්සේ පල්ලව අගනුවරට ද වැඩම කර ඇත.

. (.....)

- අංක **31** සිට **35** තෙක් ඇති ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා එහි **අංකය** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න .

31. ප්‍රථම වතාවට හරප්පා ශිෂ්ටාචාරය පිළිබඳ පර්යේෂණ පැවැත් වූ බ්‍රිතාන්‍ය ජාතිකයා කවුද ?

(1) චාල්ස් මාසන් (2) දයාරාම් ශානි (3) ඇලෙක්සැන්ඩර් කනිංහැම්

(4) ආර්.ඩී.බැනර්ජී (5) ස්ටුවට් පිගොට් (.....)

32. කුෂාණ වංසයේ ආරම්භකයා ලෙස සැලකෙන්නේ කවුද ?

(1) කණිෂ්ක (2) හුවිෂ්ක (3) වාශිෂ්ක

(4) කුජුල කැඩ්පයිසිස් (5) වීම කැඩ්පයිසිස් (.....)

33. සෘග් වෛදික දේව මණ්ඩලයට අයත් ඉන්ද්‍ර අධිපති වූයේ කුමක් සඳහාද ?

(1) මරණයට (2) දවසට (3) උදෑසනට

(4) ජලයට (5) යුද්ධයට (.....)

34. චෝලයන් විසින් ශ්‍රී ලාංකේය හමුදා ඉන්දියානු භූමියේදී පරාජය කරන ලද බව සඳහන් අභිලේඛනය කුමක්ද ?

(1) ආර්පාක්කම් (2) රාමේෂ්වරම් (3) උත්තරමේරූ

(4) තිරුමලෙයි (5) චිදම්බරම් (.....)

35. ක්‍රි.ව.10 වන සියවසේදී 17 වතාවක් ඉන්දියාව ආක්‍රමණය කරමින් තුර්කි ඇෆ්ගන් බලය ව්‍යාප්ත කිරීමට කටයුතු කළ පාලකයා කවුද ?

(1) මහමුද් බින් කාසිම් (2) ඝෝර්හි මහමුද් (3) ඝෂ්නි මහමුද්

(4) සබුක්තිජින් (5) කුටුබ් උද්දීන් අයිබෙක් (.....)

- අංක **36** සිට **40** තෙක් ප්‍රශ්නවලට අදාළව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන **1, 2, 3, 4** සහ **5** යන කවර ප්‍රකාශ යුගලය දැයි තෝරා ඊට අදාළ අංකය වරහන තුළ ලියන්න.

	පළමුවන ප්‍රකාශය	**දෙවන ප්‍රකාශය**
1	නිවැරදි ය	වැරදි ය
2	නිවැරදි ය	නිවැරදි ය
3	වැරදි ය	වැරදි ය
4	වැරදි ය	නිවැරදි ය
5	නිවැරදි ය	නිවැරදි වන අතර **පළමුවැන්න** මැනවින් පහදා දෙයි

	පළමුවන ප්‍රකාශය	**දෙවන ප්‍රකාශය**	
36.	ඉන්දුනිමින ශිෂ්ටාචාරය වර්ග සැතපුම් විසිලක්ෂයක පමණ පැතිර තිබූ බව හඳුනාගෙන ඇත.	අධිරාජ්‍යයෙක් තම කටයුතු ආරම්භ කළේ අශ්වමේධ යාගයක් පැවැත්වීමෙනි.	(.....)
37.	බුදුසමය කාමසුකල්ලිකානු යෝගය අනුමත කරයි.	සිදුහත් බෝසතාණෝ කාමසුකල්ලිකානු යෝගයෙ හි යෙදී,සත්‍ය අවබෝධ කර ගත්තේය.	(.....)
38.	ශකවරුන් විසින් තමන් යටතේ වූ ප්‍රදේශ ශත්‍රුපවලට බෙදන ලදී.	ශකවරුන් වනාහි ස්වදේශීය ගෝත්‍රයකි	(.....)
39.	මෙගස්තිනීස් නම් ග්‍රීක තානාපති මෞර්ය රාජ සභාවට එවන ලද්දේ ඇලෙක්සැන්ඩර් විසිනි.	පාටලීපුත්‍ර නගරයේ පාලනය කොමසාරිස් මණ්ඩල හයක් මගින් සිදු කළ බව මෙගස්තිනිස් වාර්තා කරයි.	(.....)
40.	මත්තවිලාස ප්‍රහසනය වනාහි පල්ලව සමයේ ආගමික ගැටුම් හා ආගමික ජීවිතය දක්වන හාස්‍යෝත්පාදක නාට්‍යයකි.	බීමත් කපිල නැමැත්තෙකු හා නාගසේන නම් බෞද්ධ භික්ෂුව අතර ඇති වූ වාදය ඇතුළත්වන අතිශය හාස්‍යජනක ලෙස ඇති මෙම කෘතිය කෙටි ඒකාංගික සංස්කෘත නාට්‍යයකි.	(.....)

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Sabaragamuwa Provincial Department of Education
சபரகமுவ மாகாணக் கல்வி திணைக்களம்

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය -2026
තෙවන වාර පරීක්ෂණය

ඉන්දීය ඉතිහාසය II (II කොටස) இந்திய வரலாறு II (பகுதி II) History of India II (Part II)	25A	S	II	13 ශ්‍රේණිය தரம் 13 Grade 13

උපදෙස්-
- පිළිතුරු සැපයිය යුතු **මුළු** ප්‍රශ්න සංඛ්‍යාව **හතරකි.**
- II කොටස **A, B** හා **C** ලෙස කොටස් **තුනකින්** සමන්විත වේ.
- **A කොටසේ** ප්‍රශ්නය අනිවාර්ය වේ.
- **B** හා **C කොටස්වලින්** එක් කොටසකින් අවම වශයෙන් එක ප්‍රශ්නයක්වත් තෝරා ගෙන **තවත්** ප්‍රශ්න **තුනකටත්** පිළිතුරු සපයන්න.
(**පළමුවන** ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා ඉන්දියාවේ **දළ සිතියමක් I කොටස** සමග සපයා ඇත.)

A කොටස

01.ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් **සියලුම ස්ථාන ලකුණු කොට නම් කරන්න.**

(i) බයිබර් දුර්ගය
(ii) ආරවල්ලි කඳු
(iii) ලෝතාල්
(iv) තාම්‍රලිප්ත
(v) නැගෙනහිර ඝාට්ස්
(vi) වින්ධ්‍යා කඳු
(vii) කාවේරි නදිය
(viii) මධුරෙයි
(ix) ප්‍රතිෂ්ඨානය
(x) සින්ධ
(xi) මථුරා
(xii) ප්‍රයාග

(නිවැරදිව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු **01** බැගිනි)

B කොටස

02.**හරප්පා ශිෂ්ටාචාරයේ දියුණු සමාජ ආර්ථික රටාවක් පැවතුණි**
(i) නවතම පුරාවිද්‍යාත්මක දත්ත අනුව හරප්පා ශිෂ්ටාචාරයේ ප්‍රධාන වාණිජ නගරය ලෙස සැලකෙන්නේ කුමක්ද ? (ලකුණු 01 යි)
(ii) හරප්පා ශිෂ්ටාචාරයේ වාසය කළායැයි සැලකෙන මානව වර්ග දෙකක් නම් කරන්න (ලකුණු 02 යි)
(iii) හරප්පා නාගරික ශිෂ්ටාචාරයේ පැවැති ආගමික විශ්වාස කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04 යි)
(iv) හරප්පා නාගරික ශිෂ්ටාචාරයේ දියුණු සමාජ ආර්ථික රටාවක් පැවැති බව නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 09 යි)

PAST PAPERS WIKI

03.ඍග් වෛදික යුගයේ සමාජ ආර්ථික සංස්කෘතික තත්ත්වයන් හි ප්‍රධාන ලක්ෂණ පැහැදිලි කරන්න. (ලකුණු 16 යි)

04.චන්ද්‍රගුප්ත මෞර්ය රජුගේ කාර්ය සාඵල්‍යය විචාරාත්මකව විමසන්න (ලකුණු 16 යි)

05.පහත මාතෘකා අතුරින් ඕනෑම **දෙකක** ඓතිහාසික වැදගත්කම පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(i) ඉන්දියාවේ කඳු වැටි

(ii) වෛදික සාහිත්‍යය

(iii) අසෝක ධර්මය

(iv) මගධයේ බල වර්ධනය (ලකුණු 8x 2 =16 යි)

C කොටස

06.ඩෙකාන් ප්‍රදේශයේ බිහි වූ විශාලතම හා පළමු අධිරාජ්‍යය ගොඩනංවන ලද්දේ සාතවාහනයන් විසිනි.

(i) සාතවාහන පෙළපතේ පළමු පාලකයා නම් කරන්න. (ලකුණු 01 යි)

(ii) සාතවහනයන් හඳුන්වන වෙනත් අන්වර්ථ නාම දෙකක් නම් කරන්න. (ලකුණු 02 යි)

(iii) සාතවාහනයන් ඩෙකානයේ බලය ව්‍යාප්ත කළ ආකාරය සැකෙවින් දක්වන්න. (ලකුණු 04 යි)

(iv) සාතවාහනයන්ගේ කලාව හා ගෘහ නිර්මාණ ශිල්පය පිළිබඳ විස්තර කරන්න (ලකුණු 09 යි)

07.ගුප්ත අධිරාජ්‍යය සම්බන්ධව පහත දැක්වෙන තේමා යටතේ සාකච්ඡා කරන්න.

(i) ගුප්ත යුගයේ වාස්තු විද්‍යාත්මක නිර්මාණ

(ii) ගුප්ත ආර්ථිකය

(iii) ගුප්ත පරිහානිය (ලකුණු 16 යි)

08.චෝල පරිපාලනයේ ප්‍රධාන ලක්ෂණ පහත මාතෘකා යටතේ පරීක්ෂා කරන්න.

(i) මධ්‍ය පාලනය

(ii) ප්‍රාදේශීය පාලනය

(iii) ග්‍රාම පාලනය (ලකුණු 16 යි)

09.පහත මාතෘකා අතුරින් ඕනෑම **දෙකක** ඓතිහාසික වැදගත්කම පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(i) සමුද්‍රගුප්ත රජුගේ යුධ ප්‍රයාණ

(ii) පුෂ්‍යභූති රාජවංසය

(iii) ධර්මපාල රජු

(iv) පාණ්ඩ්‍ය රාජධානිය (ලකුණු 8x 2 =16 යි)

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

Sabaragamuwa Provincial Department of Education

சபரகமுவ மாகாணக் கல்வி திணைக்களம்


අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය - **2026**

තෙවන වාර පරීක්ෂණය

ඉන්දීය ඉතිහාසය II இந்திய வரலாறு II History of India II	25 A	S

ප්‍රශ්න අංකය **1**

විභාග අංකය .....



සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

තෙවන වාර අවසන් පරීක්ෂණය -2026

25 -ඉන්දීය ඉතිහාසය

13 ශ්‍රේණිය

ලකුණු දීමේ පටිපාටිය



I කොටස

ප්‍රශ්න අංකය	පිළිතුරු අංකය	ප්‍රශ්න අංකය	පිළිතුරු අංකය	ප්‍රශ්න අංකය	පිළිතුරු අංකය	ප්‍රශ්න අංකය	පිළිතුරු අංකය
01	5	11	2	21	5	31	3
02	2	12	1	22	2	32	4
03	1	13	5	23	4	33	5
04	3	14	4	24	1	34	1
05	4	15	2	25	3	35	3
06	4	16	4	26	3	36	1
07	1	17	3	27	2	37	3
08	3	18	1	28	2	38	1
09	5	19	2	29	5	39	4
10	5	20	2	30	4	40	5


සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Sabaragamuwa Provincial Department of Education
சப்பரகமுவ மாகாணக் கல்வி திணைக்களம்

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය 2026
தேவன வார பரீக்ஷணය

ඉන්දීය ඉතිහාසය II இந்திய வரலாறு II History of Indial II	25 A	S

ප්‍රශ්න අංකය **1**

විභාග අංකය .....



B කොටස

02.හරප්පා ශිෂ්ටාචාරයේ දියුණු සමාජ ආර්ථික රටාවක් පැවතුණි

(i) නවතම පුරාවිද්‍යාත්මක දත්ත අනුව හරප්පා ශිෂ්ටාචාරයේ ප්‍රධාන වාණිජ නගරය ලෙස සැලකෙන්නේ කුමක්ද ? රඹිගාර් (ලකුණු 01)

(ii) හරප්පා ශිෂ්ටාචාරයේ වාසය කළායැයි සැලකෙන මානව වර්ග දෙකක් නම් කරන්න
ඔස්ට්‍රොලොයිඩ්,මොංගොලොයිඩ්,මධ්‍යධරණී,ඇල්ෆයින් (ලකුණු 02)

(iii) හරප්පා නාගරික ශිෂ්ටාචාරයේ පැවැති ආගමික විශ්වාස කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04)

ආගමික විශ්වාස

■ ශිෂ්ටාචාරයෙන් හමු වූ පුරාවිද්‍යාත්මක සාධක අනුව පහත දැක්වෙන ආගමික විශ්වාසයන් පැවති බව විශ්වාස කෙරෙන බව

- ජගන්මාතා වන්දනය
- වෘක්ෂ වන්දනය
- ජල වන්දනය

■ ජගන්මාතා වන්දනය

- මේවා සැම ගෙදරක ම තබා තිබුණු බව. 2000කට වඩා ටෙරාකොටා මූර්ති හමු වී තිබූ බව
- සශ්‍රීකත්වයේ හා සෞභාග්‍යයේ සංකේතයක් ලෙස වන්දනා කළ බව
- විශ්වයේ හා භූමියේ දෙවහන ලෙස ජගන් මාතා වන්දනය කළ බව
- විවිධ ඉරියවුවලින් යුත් කාන්තා ප්‍රතිමා ජගන් මාතාව ලෙස සලකා වන්දනා කළ බව
- ඇතැම් කාන්තාවන් විසින් පාලන කාර්යයෙහි යෙදුණු බවටද ඉඟි පවතින බව

■ වෘක්ෂ වන්දනාව

- වෘක්ෂයට හෝ වෘක්ෂයන්ට හෝ අධිපති දෙවිවරුන් සිටිනියි විශ්වාසයෙන් යුතු ව වන්දනා කළ බව
- ඇසතු, සියඹලා, නුග යන ශාකයන්ට වන්දනා කළ බවට සාක්ෂ්‍ය වීම

■ ජල වන්දනය

- ශිෂ්ටාචාරයේ සියලු ම වැසියන් ජලයට ගෞරව දැක්වූ බව
- මොහෙන්ජෝදාරෝවේ ස්නානාගාරය ජල වන්දනය සඳහා යොදා ගත් බවට සාධක හමු වීම
  - මව් දෙවහන වන්දනාව
  - පුරුෂ දේව වන්දනය
  - ලිංග වන්දනාව

(iv) හරප්පා නාගරික ශිෂ්ටාචාරයේ දියුණු සමාජ ආර්ථික රටාවක් පැවැති බව නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 09 යි)

<u>සමාජ තත්ත්වය</u>

- ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ සමාජ තත්ත්වය පිළිබඳව සැලකීමේදී හමුව ඇති මිනිස් ඇටසැකිලි හා හිස් කබල්වලට අනුව එහි මානව සම්මිශ්‍රණයකින් යුත් නාගරික සමාජයක් පැවැති බව පිළිගැනේ.ශිෂ්ටාචාරයේ සොහොන් ප්‍රදේශ කැණීම් කිරීමේදී
  ඔස්ට්‍රොලොයිඩ්, මොංගොලොයිඩ්,මධ්‍යධරණී,ඇල්පයින්

යන මානව වර්ගයන්ට අයත් හිස්කබල් හමුව ඇත. කැණීම්වලදී හමු වූ යටිරුවුලකින් සමන්විත පූජකවරයෙකුගේ යැයි අනුමාන කරන හිරිගල් හිස. මොංගෝලියානු හෝ ඇල්පයින් ගෝත්‍රිකයන්ගේ හිස්වලට සමානය.මොහෙන්ජොදාරෝවෙන් ලැබුණු නිළියකගේ යැයි සැලකෙන පිළිරුවෙහි හිස ආදී ඔස්ට්‍රොලොයිඩ් වර්ගයේ හිස්වලට සමානය.සමකාලීන ලෝකය සමග පැවැත් වූ සබඳතා මෙම ජන සම්මිශ්‍රණයට හේතු වන්නට ඇත.

- **පූජකවරුන්, පාලන තන්ත්‍රය මෙහෙය වූ ප්‍රභූ පන්තිය ,වෙළෙඳ හා ශිල්පීය ජන කොටස්, කම්කරුවන්**

යන අයගෙන් සමන්විත සමාජ ක්‍රමයක් පැවතුණු බවත් ඉන්දියාවට ආවේණික වූ වර්ණභේද ක්‍රමය මෙහි ක්‍රියාත්මක වූ බවත් ඇතැම් උගත්තු පවසති.

- මෙම සමාජ ක්‍රමය මාතෘ මූලික වූවක් බවට සිතිය හැකිය.ප්‍රධාන ඇදහිල්ල මව් දෙවඟන විම සහ කාන්තා මුද්‍රා විශාල ප්‍රමාණයක් හමුව තිබීම මෙම කරුණ තහවුරු කරන්නකි.
- මොවුන්ගේ ආහාරපාන පිලිබඳව විමසීමේදී, ප්‍රධාන ආහාරය ධාන්‍ය වූ බව පැහැදිලි වේ.තිරිඟු,බාර්ලි,තල,මෙනේරි වැනි වගාවන් සිදුකර ඇත.එමෙන්ම වී ගොවිතැන පිලිබඳව දැන සිට ඇත. මහා ධාන්‍යාගාරය හා ඒ අවටින් ලැබුණ ධාන්‍ය පොතු,ඇඹරුම් ගල්,වංගෙඩි, ආදී උපකරණයන්ගෙන් ඉහත කරුණ සනාථ කර ගත හැකිය.එමෙන්ම මාළු, කරවල,කිරි,බිත්තර හා එළුවන්,ඌරන්,කුකුළන් වැනි සතුන්ගේ මස් ආදිය ද ආහාරයට ගෙන ඇත.
- ශිෂ්ටාචාරවාසීන්ගේ ඇඳුම් පැලඳුම් හා පැළැඳි ආභරණ පිළිබඳව ද බොහෝ තොරතුරු ලැබී තිබේ.ප්‍රතිමා හා මුද්‍රාවන් පැහැදිලිවන පරිදි ඉන්දු නිම්නයේ පිරිමි උඩුකය සළුවකින් හා යටිකය ධෝතියකට සමාන ඇඳුමක් පැළැඳ ඇත.ස්ත්‍රීන් දණහිස දක්වා වැටුණු සායක් ඇඳ ඇත.උඩුකය සළුවකින් ආවරණය කර ඇත.මව් දෙවඟනගේ ප්‍රතිමාව මේ සඳහා උදාහරණයකි.
- .මාල මුදු ආදී ආභරණ පිරිමින්ගේ ආභරණ අතර වැදගත් වේ.ශිර්ෂාභරණ,ගෙල ආබරණ, බඳ ආබරණ,වළලු,මුදු, පා සළඹ ආදිය කාන්තා ආභරණ අතර වැදගත් වේ. මෙම ආබරණ රන්,රිදී,ලෝකඩ,ඊයම් වැනි ලෝහවලින් මෙන්ම පබළු,ඇත් දත්,සිප්පි කටු,සතුන්ගේ අස්ථි ආදියෙන් නිමවා ඇත.
- කාන්තාවන් රූපලාවන්‍ය කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වා තිබේ. විවිධ ආලේප වර්ග භාවිතා කළ බව වන්හුදාරෝවෙන් ලැබී ඇති ඇත් දත්වලින් නිමවා ඇති ආලේප පෙට්ටි හා පුයර පෙට්ටිවලින් තහවුරු වේ.කාන්තාවන් ඇහිබැම ආදිය පාට කිරීම සඳහා විවිධ ආලේප වර්ග භාවිතා කොට ඇත.පිරිමින්ගේ රැවුල කැපීම සඳහා භාවිතා කළ ලෝකඩ දැලිපිහි සොයාගෙන ඇත.
- ඉන්දු නිම්න ශිෂ්ටාචාර වාසීන්ගේ ක්‍රීඩා හා විනෝදාංශ පිළිබඳව ද තොරතුරු ලැබී තිබේ.ප්‍රධානතම ක්‍රීඩාව වී ඇත්තේ දාදු ක්‍රීඩාවයි.මේ සඳහා යොදාගත් දාදු කැට හමුව තිබේ.වෙස් වැනි ක්‍රීඩාවක් සඳහා යොදාගත් ඉත්තන් මෙන්ම කවපෙත්තක් ද හමුව තිබේ.ගොනුන් බඳින ලද කරත්ත තරග පවත්වා ඇත.ළමුන්ගේ සෙල්ලම් භාණ්ඩ විශාල ප්‍රමාණයක් ලැබී තිබේ.කුඩා මැටි කරත්තය ජනප්‍රිය සෙල්ලම් භාණ්ඩයක් වූ බව පෙනේ.මීට අමතරව පිඹින නලා,මැටියෙන් තැනූ

බෝනික්කන්,කුරුල්ලන්,වඳුරන්,ඇතුන් ආදිය ද ළමුන්ගේ සෙල්ලම් භාණ්ඩ විය.නළුහනකගේ , නළුවකුගේ හා බෙර වයන්නෙකුගේ මුද්‍රාවන් හමුව තිබීමෙන් පෙනෙන්නේ, ගායනය,නර්තනය වැනි කලාවන් ද විනෝදාංශ සඳහා පැවැති බවයි.

- මෙම සමාජයේ තිබූ අවමංගල සිරිත්විරිත් කිහිපයක සාධක හමුව තිබේ.

ආර්ථික තත්ත්වය

ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ ඉතා දියුණු ආර්ථික රටාවක් පැවති බව හඳුනාගත හැකිය. ඔවුන් සිය ආර්ථික කටයුතු ක්‍රම කිහිපයක් හරහා ගොඩනගාගෙන ඇත.

- කෘෂි කර්මාන්තය
- සත්ත්ව පාලනය
- කර්මාන්ත හා විවිධ වෘත්තීන්
- වෙළෙඳාම

03.ඍග් වෛදික යුගයේ සමාජ ආර්ථික සංස්කෘතික තත්ත්වයන් හි ප්‍රධාන ලක්ෂණ පැහැදිලි කරන්න.
(ලකුණු 16 යි)

ඍග් වෛදික සමාජ රටාව

- ගෝත්‍රික හා ග්‍රාමීය ලක්ෂණවලින් යුක්ත සමාජයක් පැවතීම (එහෙත් දැනට ලැබී ඇති පුරාවිද්‍යාත්මකසාක්ෂ්‍ය අනුව ප්‍රාථමික ගණයේ සමාජයක් නොවන බව තහවුරු වී ඇත)
- පිතෘ මූලික සමාජයක් පැවතීමඍග් වේදය අනුව පුතුන්ගේ ඉපදීම වඩාත් අගය කිරීමබහු ස්ත්‍රී සේවනය පැවති පිළිබඳ ව ඍග් වේදයේ දැක්වීමඑහෙත් ළමා විවාහ නොපැවතීමවැන්දඹු ස්ත්‍රියට යළි විවාහ වීමට අයිතිය පැවතීමවිවාහයේ දී සහකරු හෝ සහකාරිය හෝ තෝරාගැනීමේ අයිතිය ඔවුන්ට හිමි වීමආගමික කටයුතුවලට ස්වාමියා හා සමාන ව සහභාගි වීමට ස්ත්‍රියට හැකි වීමවිශ්වවාරා, අපාලා, සෝෂා වැනි ස්තෝත්‍ර ප්‍රබන්ධයට දක්ෂ උගත් කාන්තාවන් පිළිබඳ වීම.
- පැහැදිලි වර්ණ භේදයක් නොවූව ද ආර්ය හා අනාර්ය භේදයක් දක්නට ලැබීමකිරි, ගිතෙල්, පලතුරු, තිරිඟු, බාර්ලි සහ ධාන්‍ය වර්ග ප්‍රධාන ආහාර වශයෙනුත් විශේෂ උත්සවඅවස්ථාවන්හි දී මස් මාංසත් අනුභවයට ගැනීමසුරාව පැවති අතර උත්සව අවස්ථාවල සෝම යුෂ පානය කිරීම
- කොටස් 4කින් යුක්ත වාම් ඇඳුමක් දක්නට ලැබීම

නිවි - යටි කය ඇඳුම

පරිදෝන - උඩුකය ඇඳුම

අධිවාස - උතුරු ස`ළුව

හිස්වැස්ම

ලෝම, කපු, මුවහම් ආදියෙන් වස්ත්‍ර සැකසීම.පිරිමින් හිස් ආවරණය කර සිටීම

ස්ත්‍රී පුරුෂ දෙපක්ෂය ම ආභරණ පැලඳීම

* කර්ණ සොහන- කර්ණාභරණයක්

* කුරිර- ස්ත්‍රී හිස් පලඳනාවක්

* නික්ෂ- ගෙල මාලයක්

■ සෘග් වෛදික ආර්ථික රටාව

- කෘෂි කර්මාන්තය ප්‍රධාන කොටගත් ග්‍රාමීය කෘෂි ආර්ථිකයක් පැවතීම

- කෘෂි කටයුතුවලට ජලය ලබාගැනීමට වාරික්‍රම භාවිත කළ බව හෙළි වීම- එහි දී සත්ත්ව පාලනයට ද වැදගත් තැනක් ලැබීම

* වගා කළ බෝග වර්ග -වී, තිරිඟු, කපු, බාර්ලි සහ තෙල් ලබා ගත හැකි ධාන්‍ය වර්ග

* ඇති කළ සත්තු- ගවයෝ, අශ්වයෝ, එ`එවෝ, බල්ලෝ, බැට`එවෝ- ගවයන් කෘෂි කටයුතුවලට විශාල දායකත්වයක් ලබා දුන් අතර, පවුලක වත්පොහොසත්කම

මනින ඒකකයක් ලෙස ද වැදගත් වීම- විවිධ කර්මාන්ත හා වෘත්ති රැසක් පිළිබඳ ව සඳහන් වීම

* විවිධ කර්මාන්ත - පේෂ කර්මාන්තය, ලෝහ කර්මාන්තය, හම් කර්මාන්තය

* විවිධ වෘත්ති- වෛද්‍ය වෘත්තිය, රන් කරු වෘත්තිය, ලෝකුරු වෘත්තිය- භාණ්ඩ හුවමාරු ක්‍රමය මූලික කර ගත් වාණිජ රටාවක් පවත්වාගෙන යාම- ගංගා ඉවුරු ඔස්සේ විහිදුණු ගොඩබිම් මාර්ග මෙන් ම ගංගා ඔස්සේ විහිදුණු ජල මාර්ගයන් ද

භාණ්ඩ ප්‍රවාහනයට යොදා ගැනීම- සෘග් වේදයේ ‘නිෂ්ක’ නමින් හැඳින්වූ කිසියම් මුදල් ඒකකයක් පිළිබඳ ව සඳහන් වීම- වෙළෙඳ කටයුතුවලදී ඉන්ද්‍ර දෙවියාගේ පිළිමයකට දෙනුන් දහයක් දීම පිළිබඳ ව සඳහන් වීම- එසේම තෑගි දීමේදී නිෂ්ක 100ක් හෝ අශ්වයින් 100දෙනකුගේ දුන් අවස්ථා සෘග් වේදයේ

සඳහන් කිරීම- සෘග් වේදයෙහි ‘සමුද්‍ර’ යන්න සඳහන් වීමත්, ‘බුජ්ජු’ නැමැත්තකුගේ හබල් සීයකින් යුක්ත

යාත්‍රාවක් මුහුදේ දී අනතුරට ලක් වූ විට අස්වින් දේවතාවා ඔහු ගලවාගත් බව සඳහන් වීමත්

නිසා විදේශ වෙළෙඳාම පවතින්නට ඇතැයි විද්වතුන් පෙන්වා දීම- ක්‍රි.පූ 1500ට අයත් හෝසස්කෝයි අභිලේඛන අනුව ඔවුන් වෛදික යුගයේ දී ඔවුන්

ෆිනීසියානුවරුන් සමඟ වාණිජ සම්බන්ධතා තිබූ බව පැහැදිලි ව ම හඳුනාගෙන ඇත

<u>සෘග් වෛදික සංස්කෘතික තත්ත්වය</u>

ස්වභාවධර්මයේ බලවේගවලට දේවත්වය ආරෝපණය කොට ස්ත්‍රෝත්‍ර ගැයීමේ ස්වරූපයක් සෘග් වෛදික ආගමෙන් දිස් වේ.ස්වභාව ධර්මයාගේ ක්‍රියාකාරීත්වයෙන් හා බලවේගයන් තුළින් මිනිසා කෙරෙහි ඇතිවන බලපෑම් නිසා සිතාගත නොහැකි ගුප්ත බලවේගයන්ට දිව්‍යමය තත්ත්වයක් ආරෝපණය කොට වැඳුම්පිඳුම් කිරීම සෘග් වේද ඇදහිලිවල සමාරම්භය වී තිබේ සෘග් වෛදික යුගයේ මෙලෙස දේව මණ්ඩලයක් සඳහන් වන හෙයින් බහුදේවවාදී ආගමික රටාවක් ඉස්මතු විය.මෙම පිරිස ප්‍රධාන වර්ග තුනකට බෙදා තිබුණි.

- ☞ ආකාශ
- ☞ අන්තරීක්ෂ
- ☞ භූමස්ත

මෙම එක් එක් දෙවියා ස්වභාවධර්මයේ විවිධ අංග නියෝජනය කළේය.

ඉන්ද්‍ර -ශක්තිය,වැස්ස,මේඝ සර්ජනා,කුණාටුව,යුද්ධය

වරුණ -අහසට අධිපති හා ශාක හා සත්ව ජීවිත පවත්වාගෙන යාමට

අග්නි -ගින්නට අධිපති,නිවසට අධිගෘහිත දෙවියා

යම -මරණයට අධිපති

සූර්ය -දවසට අධිපති

පෘථිවි -පොළොවට අධිපති

ඌෂා -උදෑසනට අධිපති

චන්ද්‍ර -සඳු දෙවියා

සාවිත්‍රී -ශක්තිය ලබා දෙන්නා

මරුත් -සුළඟට අධිපති

පර්ජන්‍ය -වැස්සට අධිපති

සෝම -සුරාවට අධිපති

සරස්වති -කලාවට අධිපති

ආදිත්‍ය -දෙවිවරුන්ගේ ශ්‍රේෂ්ඨතම මාතාව

- ඉහත දෙවිවරුන් මෙලොව උපත ලද අය ලෙස සැලකුවත් ඔවුන් අමරණීයය.පෙනුමෙන් මානව රූපීය.මෙම දෙවිවරු ගමන් කරනුයේ අශ්වයන් හෝ වෙනත් සතුන් විසින් ඇදගෙන යනු ලබන රථවලිනි.මෙම රථ ගමන් කරනුයේ අහසිනි.මොවුන්ගේ ජනප්‍රිය ආහාරය සෝම යුෂයි.දෙවිවරු සතු බලතල ලෙස පෙනෙන්නේ ඓශ්වර්යය,ශක්තිය,ස්වාමීත්වය,ඥානය හා සත්‍යයයි. දෙවිවරු යහපත් ක්‍රියාකාරීත්වයකින් යුතුය.රුද්‍ර පමණක් අයහපත් ක්‍රියාකාරකම් ඇත්තෙක් ලෙස දක්වා ඇත

- **යාගය**

1.ගෘහකර්මාණි යාගය - උත්පත්තිය විවාහය වැනි දෛනික ජීවිතයට සම්බන්ධ විවිධ අවස්ථාවලදීත් ,මරණය,මුතුන් මිත්තන් පිදීම,ගව සම්පත බෝකර ගැනීම,වගාවන් දියුණුකර ගැනීම ආදිය සඳහා මෙම යාග උත්සව සංවිධානය කොට ඇත.මෙම යාගය ඉතාමත් සරලය.කිරි,ධාන්‍ය,ගිතෙල් පුද පූජා භාණ්ඩ ලෙස ඉදිරිපත් කළේය.මෙවැනි සරල යාග ගෘහපතියා විසින්ම තවත් බ්‍රාහ්මණ පූජකවරයෙකුගේ ආධාරය ඇතිව පවත්වන ලදී.මෙම යාගය ධනවත්,නිර්ධන දෙපිරිසටම කළ හැකි විය.

2.මහායාග - මෙම යාග බොහෝ විට පැවැත්වූයේ ඉන්ද්‍ර දෙවියා සම්බන්ධවයි.රදලවරු හා ධනවත් අය හෝ රජවරුන් මෙම යාග පවත්වා ඇත.මේ සඳහා විශේෂ වූ වේදිකා ගොඩනංවා පූජකවරුන් විශාල සංඛ්‍යාවක් සහභාගීකරවාගෙන ස්තෝත්‍ර ගීතිකා රාශියක් උපයෝගී කොටගෙන සිදුකරන ලද බව සෘග් වේදයේ සඳහන් වේ.මේ සඳහා යූෂ පමණක් නොව සත්ව බිලිද උපයෝගී කරගන්නා බව සෘග් වේදයේ දැක්වේ.

04.චන්ද්‍රගුප්ත මෞර්ය රජුගේ කාර්ය සාඵල්‍යය විචාරාත්මකව විමසන්න (ලකුණු 16 යි)

<u>චන්ද්‍රගුප්ත මෞර්ය රජු (ක්‍රි.පූ.324-300)-වසර 24</u>

මෞර්ය පෙළපතේ ආරම්භය පිළිබඳව අති මතවාද

- හින්දු මූලාශ්‍රවලට අනුව චන්ද්‍රගුප්ත නන්ද රජෙකුට දාව **"මුරා"** නම් වූ ශූද්‍ර කාන්තාවකගේ කුස උපන් අයෙකි.මූලාශ්‍රවල සඳහන් වන්නේ නන්දවරු ද පහත් ජන්මයක් සහිත පිරිසක් වූ බවයි.
- බෞද්ධ සාහිත්‍යයට අනුව පිප්ඵලී වනයේ මෝරිය හෙවත් මෞර්යයන්ට චන්ද්‍රගුප්තගේ පෙළපත අයත් වන බවයි.
- මහා බෝධි වංසයට අනුව මොහු ක්ෂත්‍රිය වංශිකයෙකි. **"මෝරියානං ඛත්තියානං වංසේ ජාතං"** (මෝරියයෝ ක්ෂත්‍රිය වංසයේ උපන් අය වෙති.)
- මෝරියන් හා නන්දයන් අතර සම්බන්ධයක් පැවැති බව මුද්‍රාරාක්ෂසයේ සඳහන් වේ.

☞ ග්‍රීක මූලාශ්‍රවල සන්ද්‍රාකොට්ඨාස්,සන්ද්‍රකොටුස්,ඇන්ඩ්‍රකොටුස් යන නම්වලින් චන්ද්‍රගුප්තව හඳුන්වා ඇත.

ළමා කාලය

සේනාසංවිධාන කටයුතු හා ඉන්දියාව එක්සත් කිරීම

මගධය අත්පත්කොට ගැනීම

වයඹදිග ඉන්දියාව අත්පත්කොට ගැනීම

- චන්ද්‍රගුප්ත මෞර්යයන්ගේ විශිෂ්ටතම කාර්යය වන්නේ ග්‍රීක පරගැනිභාවයෙන් වයඹදිග ඉන්දියාව මුදා ගැනීමයි.රාජත්වයට පත් වී ටික කලකට පසුව ඔහු ඒ සඳහා සුදානම් විය.මේ කාලය වන විට ඇලෙක්සැන්ඩර් රජු මිය ගොස් සිටි නිසා ග්‍රීක අධිරාජ්‍යය ක්‍රමයෙන් පරිහානියට පත් වන ආකාරයත් ,යටත් ප්‍රදේශ ක්‍රමයෙන් නිදහස් වීමත් සිදු විය.
- ඇලෙක්සැන්ඩර්ට නතුව පැවති ප්‍රදේශ තුළ අර්බුධකාරී නොසන්සුන් තත්ත්වයක් ද ඇතිවී ඇත.මේ නිසා චන්ද්‍රගුප්තට එම ප්‍රදේශ යටත් කරගැනීමට එතරම් අපහසු නොවන්නට ඇත.ක්‍රි.පූ.323 දී ඇලෙක්සැන්ඩර් අභාවයට පත්වීමෙන් පසුව එම පෙදෙස්වල නොසන්සුන් තත්වයක් ඇති වී ඇත. මෙසේ රට අර්බුධවලින් ගහණව පැවැති නිසා චන්ද්‍රගුප්තට පහසුවෙන් පංජාබ් හා වයඹදිග ඉන්දීය පෙදෙස් ජයගත හැකි විය.ඇලෙක්සැන්ඩර්ගේ මරණින් පසු ඉන්දියාවේ ප්‍රාදේශීය පාලකවරුන්ගේ ආධිපත්‍යය තුරන්කළ හැකි වී ඇත.මෙම සටනේ නායකයා සන්ද්‍රාකොට්ඨාස් බව ජස්ටින් පවසයි.

- මේ අයුරින් චන්ද්‍රගුප්ත ඉන්දියාවේ රාජ්‍ය බලය තහවුරු කරගන්නා අතර, සෙලියුකස් නිකේටර් නම් පාලකයා යටතේ ග්‍රීක අධිරාජ්‍යය නැවත බලවත් වන අතර මොහු **බැබිලෝමියාව,බ්‍රැක්ටියාව** ආදී ප්‍රදේශ අල්ලාගෙන ක්‍රි.පූ. 305 දී පමණ ඉන්දියාවට පැමිණ වයඹ දිග ප්‍රදේශයේ බලය පුළුල් කොට ඇති බව **ඔස්ටින් නම් ඉතිහාසඥයා** දක්වා ඇත.එහෙත් නිකේටගේ හමුදාවට විරුද්ධව යුද කළ චන්ද්‍රගුප්තයන් නිකේටර්ගේ හමුදාව පරාජයට පත් කොට එළඹීම

- බටහිර ප්‍රදේශයේ බලය ද මෙතුමා යටතේ පැවැති බව ඊට පසු කාලයකදී රුද්‍රදාමන් නම් ශක රජු පිහිටු වූ ජුනාගාධ ශිලාලිපියෙන් තහවුරු වී තිබේ. එහි සඳහන් වන ආකාරයට චන්ද්‍රගුප්ත රජුගේ කාලයේදී වෛශ්‍ය පුෂ්‍යගුප්ත නම් ප්‍රාදේශීය ආණ්ඩුකාරයෙක් සුදර්ශන නම් ජලාශයක් ඉදිකර තිබේ.

- දකුණු ඉන්දියානු පෙදෙස්වල ද රජුගේ බලය පවතින්නට ඇතැයි අනුමාන කළ හැකි සාධක කිහිපයක් හමු වී තිබීම

- මේ අනුව ඉන්දියාවේ විශාල පෙදෙසක් එක්සේසත් කළ ඉන්දියාවේ පළමු අධිරාජයා ලෙස චන්ද්‍රගුප්ත මෞර්ය රජු හඳුනාගත හැකි වීම

05.පහත මාතෘකා අතුරින් ඕනෑම **දෙකක** ඓතිහාසික වැදගත්කම පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(i) ඉන්දියාවේ කඳු වැටි
(ii) වෛදික සාහිත්‍යය
(iii) අශෝක ධර්මය
(iv) මගධයේ බල වර්ධනය (ලකුණු 8x 2 =16 යි)

(i) ඉන්දියාවේ කඳු වැටි

හිමාලය කඳුවැටිය

- හිමාලය කඳුවැටිය ඉන්දියාව හුදෙකලා කිරීමට සමත් වූයේ යැයි මුල් කාලීන අදහසක් විය.

එහෙත් එය ඉන්දියාව ආරක්ෂා කිරීමට හේතු වූවා මෙන් ම කිසිදු විටෙක ඉන්දියානුවන්ට

බාධකයක් නොවී ය.කුෂාණ පාලකයෝ හිමාලය පසු කර චීන දේශ සීමාව දක්වා ම පාලනය කළහ.

ඉන්දීය බෞද්ධ සංස්කෘතිය හිමාල යෙන් එපිට සේද මාවත පුරා පැතිර ගිය අතර චීනයට

බුදු දහම ව්‍යාප්ත වීමට හේතු විය.

-වර්තමානයේ හමු වී ඇති පුරාවිද්‍යාත්මක සාධක අනුව බෞද්ධ සංස්කෘතිය මොංගෝලියාව

තෙක් ම තදින් ව්‍යාප්ත වී තිබූ බවට කහවුරු වේ

-හූණ ආක්‍රමණිකයන්ට ඉන්දීය පාලකයන් ඉතා හොඳින් මුහුණ දුන් අතර ගුප්ත අධිරාජ්‍යය

පිරිහෙන අවස්ථාවේ දී පහර දුන් බැවින් ඇතැම් ප්‍රදේශ යටත් වීම

ඉන්දියාවේ ආරක්ෂකයා වූ හිමාලය කඳුවැටිය ඉන්දියාවේ ඉතිහාසය ගොඩනැඟීමේ දී අතිශය

වැදගත් වීම. අඩි 20,000කට වඩා උස් වූ ශිඛර 114කින් පමණ සමන්විත වේ. උස ම ශිඛරය

-අඩි 29,140ක් උස් වූ එවරස්ට් හෙවත් ගෞරි ශංකර් ය.ඉන්දියාව, ආසියා මහද්වීපයේ සෙසු රටවලින් වෙන් කරන්නේ හිමාලය කඳුවැටියයි. ආසියානුමහද්වීපයේ සිට ගොඩබිම් මාර්ගයකින් ඉන්දියාවට සංක්‍රමණය වීමේ දී හෝ ආක්‍රමණයක් මෙහෙයවීමේ දීප්‍රධානත ම බාධාව වූයේ හිමාලය කඳුවැටිය යි.එහෙත් හිමාලය ඔස්සේ වැටී ඇති මාර්ගවලින් වෙළෙඳුන්, සංචාරකයන් හා ධර්ම ප්‍රචාරකයන්ඉන්දියාවෙන් විදේශවලටත්, චීනය, මධ්‍ය ආසියාව හා මොංගෝලියාව වැනි ප්‍රදේශවලින් ඉන්දියාවටත් සුළු වශයෙන් ආ ගිය බවට තොරතුරු ලැබේ.

උතුරු දෙසින් ඉන්දියාවට මහා ආරක්ෂාවක් සපයමින් ආසියාවෙන් වෙන් කිරීමට සමත් වූහිමාලය පර්වතය නිසා ම පැරණි ඉන්දියානුවන් තමාට ආවේණික සංස්කෘතියක් ගොඩනැඟීමට හැකි විය.හිමාලය කඳු විදේශීය ආක්‍රමණිකයන්ට මහා බාධකයක් වූවා පමණක් නො ව ටිබෙටය හරහා හමා එන වියළි වුවත් දැඩි සීත සුළඟින් ඉන්දියාවට ආරක්ෂා වීමට එය පවුරක් විය.එමෙන් ම ධාරාණිපාත මෝසම් වර්ෂාව සෑහෙන දුරකට සීමා කොට ඉන්දු ගංගාතැනිතලාවන්හි පසෙහි සරුසාරත්වය රැකගෙන ඒවා මු`ඵ ඉන්දියාවේම සශ්‍රීක ප්‍රදේශ බවට පත් කිරීමට ද එමගින් සැලැසුණු සේවය අති විශාල ය.

<u>හින්දු කුෂ් කඳුවැටිය</u>

■ ජන සංක්‍රමණවලින් මෙන් ම විදේශීය ආක්‍රමණවලින් ද ඉන්දියානු ඉතිහාසය ප්‍රබල වෙනස්කම්වලට

භාජනය වීමේ දී වයඹ දිගින් ඇති හින්දුකුෂ් කඳු පෙළේ වැදගත්කම

■ ඉන්දියාවේ වයඹදිග ආරක්ෂකයා හින්දුකුෂ් කඳු පෙළ යි. සුලයිමාන් හා කිර්තාර් යන නම්වලින්

හැඳින්වෙන කඳු වැටි ද මෙම හින්දුකුෂ් කඳු පෙළටම අයත් සේ සැලකෙ යි.

■ මෙම කඳු පෙල නිසා, පැරණි ඉන්දියාව පර්සියාව හෙවත් ඉරානයෙන් වෙන් විය. මෙම කඳු පෙළ

ඉන්දියාවට ආරක්ෂාව සැපයූ මහා ආරක්ෂකයකු වුවත්, මෙම කඳු පෙළේ තැන තැන පහත් දුර්ග

පිහිටා තිබිණි. බයිබර් හා බෝලාන් දුර්ග ඒ අතරින් වඩා වැදගත් වේ. මෙම දුර්ග හරහා ඉන්දියාවට

ආක්‍රමණ හා සංක්‍රමණ රැසක් සිදු වූ අතර ඒවා ඉන්දියානු දේශපාලන, සමාජ හා සංස්කෘතික

ක්ෂෙත්‍රයට බෙහෙවින් බලපෑම් කළේය.

■ එසේම මෙම කඳු පෙළේ උතුරෙන් පටන්ගෙන ඇද හැලෙන ස්වාත්, චිත්‍රාල්, ගුමාල්, කාබුල්, තෝච්,

කුරාම් ආදි නදි නිම්න ද, ඉන්දියාවට පිවිසීමේ මාර්ග ලෙස ප්‍රයෝජනයට ගැනිණි.

වින්ධ්‍යා හා සත්පුර කඳු- වින්ධ්‍යා කඳු වැටිය කතියවාරේ සිට ඊසාන දිගට විහිදෙමින් සැතපුම් දහස් ගණනක් පැතිර

තිබෙන සුවිශාල කඳුවැටියකි. සත්පුර කඳු වැටිය නර්මදා නදියට දකුණින් පිහිටා ඇත.

උතුරු ඉන්දියාවත්, දකුණු ඉන්දියාවත්, වෙන් කරන ප්‍රධානතම භූගෝලීය පිහිටීම වින්ධ්‍යා කඳු

වැටිය යි.- වින්ධ්‍යා කඳු වැටියෙන් උතුරු ඉන්දියාව හා ඩෙකානය වෙන් කිරීම නිසා මෙම ප්‍රදේශ දෙක

අතර සබඳතා හා ගැටුම්, සැලකිය යුතු මට්ටමකින් අඩු විය. එමෙන් ම උතුරේ සිට පැමිණි

ආක්‍රමණිකයන්ට දකුණු ඉන්දියාවට පිවිසීමේ ප්‍රධානතම බාධකය වූයේ වින්ධ්‍යා කඳු වැටිය යි.- එහෙත් මෙම කඳු පෙළේ බටහිරත්, කැම්බේ බොක්කත් අතර සරුසාර තැනිතලාවක් පිහිටා ඇත.

එය බැරෝඩා කපොල්ල යි. සාතවාහන, බටහිර චාලුක්‍ය සහ හර්ෂවර්ධන වැනි පාලකයන් මෙම

තැනිතලාවේ සටන් මෙහෙයවා ඇත.

<u>අරවල්ලී කඳුවැටිය</u>

තාර් කාන්තාරය සීමා වූයේ මෙම කඳු වැටිය නිසාවෙනි. එමෙන් ම මෙම කඳු වැටිය, වයඹ දිගින්

පැමිණි ආක්‍රමණිකයන්ට උතුරු ඉන්දියාවට පිවිසීමේ දී විශාල බාධකයක් ද විය.

නැගෙනහිර සාටිස් හා බටහිර සාටිස් කඳුවැටි

දකුණු ඉන්දියාවේ පිහිටි සාටිස් කඳු වැටි ද වැදගත් භූගෝලීය පිහිටීම් ය. නැඟෙනහිර සාටිස් හාබටහිර සාටිස් කඳුවැටි දෙක අතර පිහිටි තැනිතලා භූමිය ඩෙකාන් සානුව නමින් හඳුන්වයි.- බටහිර සාටිස් කඳුවැටිය අතිශය උස් කඳුවැටියකි. මෙය මුහුදට දැඩි ලෙස සමීප ව පිහිටාතිබීම නිසා සැතපුම් දහස් ගණනක් යන තෙක් ම මිනිස් වාසයක් බිහි වීමට ප්‍රමාණවත් ඉඩක්නොවීය.

- බටහිර සාටිස් කඳු වැටිය බටහිර වෙරළට සමාන්තරව දළ බෑවුමකින් යුතු ව නිම්න, කඩතොලු,

කපොළු තැනිතලා සීමිත වෙමින් කඳු වැටි පිහිටීම නිසා ගංහා බිහි වීමට බාධාවක් විය. මේ

නිසා ම නර්මදා හා තප්ති නදී දෙක හැරුණු විට ඉන්දියාවේ බටහිර වෙරළට කිස`ිදු ගංගාවක්

ගලා නොබසී.

- නැගෙනහිර සාටිස් කඳුවැටිය ඊට හාත්පසින් ම වෙනස් වීම- මෙම කඳු වැටිය හා වෙරළ අතර විශාල පරතරයක් තිබීම, ගංගා කීපයක් ගලා යාම ආදි හේතු

සාධක නිසා මෙම ප්‍රදේශයේ රාජවංශ ගණනාවකට සිය බලය ගොඩනහාගැනීමට උපකාරී විය

(ii) වෛදික සාහිත්‍යය

වෛදික සාහිත්‍යය-

-වේද ග්‍රන්ථ ඇතුළු ව ක්‍රි.පූ. 5 වන සියවස තෙක් කාලය තුළ රචනා වූ පොත්පත් ය

-සෘග් වෛදික යුගයේ දී රචනා වූ සෘග් වේදය හා පශ්චාද් වෛදික යුගයේ ලියැවී ඇති

යජුර්,සාම අථර්වන් යන වේද ග්‍රන්ථ, බ්‍රාහ්මණ, ආරණ්‍යක උපනිෂද්, පුරාණ, වේදාංග, උපවේද සහ සූත්‍ර

-ආර්යයන්ගේ දේශපාලන, ආර්ථික, ආගමික හා සමාජීය තොරතුරු රැසක් හෙළි වීම

බ්‍රාහ්මණ ග්‍රන්ථ - වෛදික මන්ත්‍රයන්ට අර්ථ විවරණ සපයමින් giයෙන් ලියැවී තිබීම

ආරණ්‍යක ග්‍රන්ථ - දෙවියන්, ආත්මය, ලෝකය හා මිනිසා පිළිබඳ දැනීම ආදි විවරණය

කිරීම

උපනිෂද් - භාරතීය දර්ශනය ඒකරාශී වී තිබීම වේදාන්ත යනුවෙන් ද හැඳින්වීම

කර්ම හා ඥාන යන අංශ දෙකක් පිළිබඳ අවධානය යොමු කර තිබීම

දාර්ශනික අගයකින් යුක්ත වීම

(iii) අසෝක ධර්මය

අසෝක රජු බුදුදහම වැළඳ ගැනීමෙන් පසු ,සිය රට වැසියා වෙත ප්‍රචාරය කිරීම සඳහා ඔහුගේම දහමක් ඉදිරිපත් කරන ලදී. අසෝක ධර්මය යනු කුමක්දැයි යන්න පිලිබඳව විද්වතුන්ගේ විවිධ අදහස් පවතී.

1.ජ්ලිට් සහ බියුලර් -අසෝක ඉගැන් වූ ධර්මය දේශපාලන සහ සදාචාර ප්‍රතිපත්ති ඇතුලත් රාජ ධර්මයකි.

2.රාද් කුමුද් මුකර්ජී -අසෝක ධර්මය යවනු සියලු ආගම්වල සාරයයි

3.බරුවා -බුදුදහමේ ලෞකික අංශයට අදාල ඉගැන්වීම් ඇතුලත්ය.

4.වින්සන්ට් ස්මිත් -ඉන්දියානු සෑම ආගමකටම පොදු වූ විශ්ව දහමකි

5.බණ්ඩර්කාර් -බුදුසමයේ මූලික ධර්මතා ඇතුළත් උපාසක ධර්මයක්

- බොහෝ විද්වතුන්ගේ මතය වන්නේ අසෝක ධර්මයට බොහෝ ආභාෂය ලබා ඇත්තේ බුදු දහමෙන් බවයි. සිඟාලෝවාද,ව්‍යග්ගපජ්ජ,පරාබව, ආදී සූත්‍ර දේශනාවල ගිහි විනය සම්බන්ධ ඉගැන්වීම් රාශියක් අසෝක ධර්මයෙහි ඇතුළත්ය.
- අසෝක අධිරාජයා සිය වැසියාගේ යහපත් පැවැත්ම සඳහා ඉදිරිපත් කළ අසෝක ධර්මය සිය රාජ්‍යයේ පිළිපැදිය යුතු විනය නීති මාලාවක් සේ ජනතාවට ඉදිරිපත් කර ඇත. මේවා සෙල්ලිපිවල ග්‍රීක්,ඛරෝෂ්ඨී,බ්‍රාහ්මී ආදී භාෂාවන්ගෙන් ලියා ඇත.

<u>අසෝක ධර්මයේ අන්තර්ගතය</u>

අසෝක ධර්ම ප්‍රතිපත්තිය සදාචාර සංවර්ධනය හා සාමකාමී සහජීවනය ඇති කිරීමේ පරමාර්ථයෙන් බිහිවුවකි. ඒ බව පහත කරුණුවලින් සනාථ වේ.

- ❖ සුස්රූස (කීකරුභාවය)

දෙමාපියන්ට.වැඩිහිටියන්ට,ගුරුවරුන්ට, සහ උසස් කුලීනයන්ට කීකරු වීම

- ❖ ආචිති(ගරුත්වය)

සිසුන් ගුරුවරුන් කෙරෙහිත්,ගුරුවරුන් සිය ශාස්තෘන් කෙරෙහිත්,ගෞරවයක් දැක්වීම

- ❖ සම්ප්‍රතිපත්ති (නිරවද්‍ය සංග්‍රහය)

බ්‍රාහ්මණයන්ට හා ශ්‍රමණයන්ට ,ඥාතීන්ට,සේවකයන්ට හා යැපෙන්නන්ට,දිළින්දන්ට සහ අසරණයන්ට,මිතුරන්ට සහ සගයන්ට සංග්‍රහ කිරීම.

- ❖ දාන(නිදහස)

බ්‍රාහ්මණයන්ට,ශ්‍රමණයන්ට,මිතුරන්ට,ඥාතීන්ට හා වයෝවෘද්ධ ජනයාට දාන දීම

- ❖ ප්‍රාණානම් අනාරම්භ (සතුන් ඝාතනයෙන් වැලකීම)

සියලුම පණ ඇති සත්ත්වයන් ඝාතනයෙන් හා ඔවුන්ට වධහිංසා කිරීමෙන් වැලකීම

- සාමාන්‍ය ජීවිතයේදී පුද්ගල සම්බන්ධතාවල සාර්තකත්වයට හේතුවන කරුණු ද අසෝක ධර්ම ප්‍රතිපත්තියෙහි අන්තර්ගතය.

උදා- සත්‍යගරුක වීම,කෘතඥේදීත්වය,දැඩි කැපවීම,ත්‍යාගශීලීත්වය.ආදායම් වියදම් සමබරව පවත්වාගෙන යාම

අසෝක ධර්මයේ අංග ඔහු පිහිට වූ සෙල්ලිපි ඇසුරෙන් හඳුනාගත හැකිය. එම සෙල්ලිපි කිහිපයක් පහත පරිදි හඳුනා ගනිමු.

01.දිල්ලි තෝප්‍රා ටැම් ලිපිය

“මාගේ ධර්මය යනු කුමක්ද? ප්‍රශ්නයට පිළිතුරු ලෙස මේ ලිපිය ලියා ඇත.

එහි යහපත් දෑ බොහෝය. කරුණාව,දන්දීම,සත්‍යවාදීබව,පිරිසිදු බව යන ඒවාය.....අපා දෙපා සිව්පා බහුපා සතුන්ට ප්‍රාණදානය හෙවත් අභයදානය දිය යුතුය.මව්පියන්ට හා වැඩිහිටියන්ට කිකරුවීම,ඥාතිසංග්‍රහය,සතුන්ට දයාව,දහමෙහි හැසිරීම,ගුරුවරුන්ට වතාවත් කිරීම,මහණ බමුණන්ට දන්දීම,අරපරෙස්සම,අල්පේච්ඡ බව සහ වෙනත් යහපත් දෑ බොහෝය.....”

02.හයවන ගිරි ලිපිය

“මුළු ලොවෙහිම වැඩ සැලසීම මට අයත් ක්‍රියාවක් කොට සලකමි.ඊට වඩා සේවයක් මට නැත.මා විසින් කරනු ලබන යම් ව්‍යායාමයක් වේද ඒ සියල්ල සත්වයන්ගේ මෙලෝ පරලෝ දෙකෙහි යහපතට ඔවුන්ට මා ඇති ණයෙන් නිදහස් වීමටය.”

03.ධෞලි සුළු ගිරි ලිපිය

“සවේ මුනිජාවේ පජා ඉම” -සියලු මනුෂ්‍යයෝ මාගේ දරුවෝය.

- බරෝෂ්ටි,බ්‍රාහ්මී,ඇරමයික්,ප්‍රාකෘත අක්ෂර වලින් සහ මාගධී,ග්‍රීක,ඇරමයික් ආදී භාෂාවන්ගෙන් ලියවීම
- ධර්ම මහාමාත්‍රවරුන් පත් කිරීම

(iv) මගධයේ බල වර්ධනය

01.භූගෝලීය සාධක

- ගංගායමුනා තැනිතලාව ඉන්දියාවේ භූගෝලීය පිහිටීම අතින් වැදගත්ම කලාපයයි.මෙම භූගෝලීය කලාපය තුළ පිහිටි මගධයට, අධිරාජ්‍යයක් ලෙස වර්ධනය වීමට අවශ්‍ය සියලු සාධකයන් ගැබ්ව තිබුණි. විශේෂයෙන් වෙනත් රාජධානිවලට වඩා ස්වභාවික පිහිටීමක් මගධයට තිබුණි.සරු පසක් තිබීම හා හිතකර දේශගුණයක් තිබීම නිසා දියුණු කෘෂි ආර්ථිකයක් ගොඩනැංවීමට හැකියාව තිබුනි.
- ගංගා ගං නිම්නය ඔස්සේ විහිදුණු දීර්ග තැනිතලාව ගමනාගමනයට මෙන්ම විවිධ ආර්ථික කටයුතුවලට වැදගත් විය. මෙම ප්‍රදේශයේ ගංගා -යමුනා ඇතුළු අතු ගංගා රාශියක් තිබිණි. ඉන්දියාවේ වැඩිම වර්ෂාපතනයක් ලැබුනේ මෙම ප්‍රදේශයටයි.

උතුරින්	ගංගා නදිය
දකුණින්	වින්ද්‍යාව
නැගෙනහිරින්	චම්පා නදිය
බටහිරින්	සෝණ නදිය

02.ආරක්ෂක සාධක

බෞද්ධ සාහිත්‍යයේ සඳහන් වන්නේ මගධය පංචමහා පර්වතවලින් ආරක්ෂා කළ රාජධානියක් බවයි. එම පර්වත මෙසේය.

වේභාර ,වේපුල්ල, ඉසිගිලි,ගිජ්ඣකූට ,පාණ්ඩව

මෙම පර්වත වලින් මගධයට විශාල ආරක්ෂාවක් සැලසී තිබේ.

03.ආර්ථික සාධක

- ගංහා නදියේ අතු ගංහාවක් වූ සෝණ නදියට මුහුණලා පිහිටි මගධය අර්ථික අතින් ශක්තිමත් විය.උතුරු ඉන්දියාවේ දියුණුතම වෙළඳ ආධිපත්‍යය මගධය සතු විය. කෘෂිකර්මාන්තය ඉතා උසස් මට්ටමක පැවැතුණි. මගධයේ වෙල්යාය පිළිබඳව බෞද්ධ සාහිත්‍ය යේ පවා සඳහන් වේ. හිමාලයෙන් කඩා හැලෙන ගංහා,යමුනා, යන ප්‍රධාන ගංහා දෙක කේන්ද්‍රකරගත් ඒවායේ ශාඛා ප්‍රශාඛාවන්ගෙන් මගධය සරුසාරවත් වී ඇත.ස්වභාවික යපස් නිධි බහුල ප්‍රදේශයකි.
- විශේෂයෙන් චම්පා නදිය ඛණිජ සම්පත්වලින් ගහණ නදියක් සේ සැලකේ.මීට අමතරව යකඩ වැනි ඛණිජ සම්පත් ,යුද්ධ මෙවලම් තැනීමට යොදාගත හැකි විය.වනාන්තරවලින් දැවදඩු, ඇතුන් ආදිය ලබා ගතහැකි විය.

04.රාජවංශවල ක්‍රියාකාරීත්වය

මගධ බල වර්ධනයට බලපෑ ප්‍රධානතම සාධකය ලෙස හඳුනාගත හැක්කේ රාජවංසවල ක්‍රියාකාරීත්වයයි.මගධයේ බලයට පත් වූ ප්‍රධාන රාජවංස හතරක් හඳුනාගත හැකිය.

- ✧ හර්හංක රාජවංසය
- ✧ සිසුනාග රාජවංසය
- ✧ නන්ද රාජවංසය

මෙම රාජවංසවල පාලකයන් අනුගමනය කළ ක්‍රියාමාර්ගවල ප්‍රතිඵල ලෙස ක්‍රමිකව මගධය අධිරාජ්‍යයක් දක්වා ව්‍යාප්ත විය.මොවුන් තම රාජ්‍යය වර්ධනය වීම කෙරෙහි අනුගමනය කළ ප්‍රධාන ක්‍රියාමාර්ග දෙකක් විය.

යුධ ක්‍රියාමාර්ග හා විවාහ සබඳතා වශයෙනි.

C කොටස

06.ඩෙකාන් ප්‍රදේශයේ බිහි වූ විශාලතම හා පළමු අධිරාජ්‍යය ගොඩනංවන ලද්දේ සාතවාහනයන් විසිනි.

(i) සාතවාහන පෙළපතේ පළමු පාලකයා නම් කරන්න. (ලකුණු 01 යි)

සීමුක

(ii) සාතවහනයන් හඳුන්වන වෙනත් අන්වර්ථ නාම දෙකක් නම් කරන්න. (ලකුණු 02 යි)

සලිවාහන ,සාතකර්ණි,ආන්ද්‍රජාති

(iii) සාතවාහනයන් ඩෙකානයේ බලය ව්‍යාප්ත කළ ආකාරය සැකෙවින් දක්වන්න. (ලකුණු 04 යි)

■ දකුණු ඉන්දියාවේ ගෝධාවරී හා ක්‍රිෂ්ණ තුංගභද්‍ර ගංගා අතර ප්‍රදේශය සාතවාහන හෙවත් ආන්ද්‍ර බල ව්‍යාප්තිය පැවැති ප්‍රදේශය යි.

ශාතකර්ණී, ශ්වාතකර්ණී, ආන්ද්‍රජාති, ආන්ද්‍රභෘත්‍ය, සාලිවාහන, ශාන්තිවර්ණ ආදි නම්වලින් ද මොවුන් හඳුන්වා ඇත.

■ ප්‍රතිෂ්ටානය මධ්‍යස්ථානය කොට මොවුහු පාලනය මෙහෙය වූය. මෙම රාජධානිය වින්ධ්‍යා කඳුවැටියෙන් ඔබ්බෙහි දකුණු ඉන්දියාවේ ඉහළ ඩෙකාන් ප්‍රදේශයේ බිහි වූ විශාලතම හා පළමු අධිරාජ්‍යය යි.

■ ශුංග හා කාන්ව රාජවංශ යටපත් කොට ඩෙකානයේ නව රාජවංශයක් ගොඩනැඟූ පළමු වන පාලකයා වූයේ සීමුක ය.

■ මෙම පෙළපතේ වැදගත් රජවරු

පළමු සාතකර්ණී රජු

-වසර 56ක් රජ කළ අතර මාල්වා ප්‍රදේශය, අනූප දේශය හා විදර්භය අල්ලා ගනිමින්

-මධ්‍යම, බටහිර හා උතුරු ඩෙකානයේ බලය ව්‍යාප්ත කිරීම.

- අශ්වමේධ යාග දෙකක් පැවැත්වීම හා දක්ෂිණාපථපති යන නාමය භාවිත කිරීම.- ගෞතමීපුත්‍ර සාතකර්ණී රජු

- ශක,යවන හා පාර්තියන් බලය විනාශ කිරීමට සමත් වීම.

- නහපාන නම් ශක රජු පරාජයට පත් කරමින් ඔහු යටතේ පැවැති අවන්ති, මාල්වා,කතියවාර්, අපරාන්ත යන ප්‍රදේශ අත්පත් කර ගැනීම

- මේ අනුව උතුරින් මාල්වා හා කතියවාර් තෙක් නැහෙනහිරින් බෙරාර් සිට කොන්කාන්තෙක් දකුණින් ක්‍රිෂ්ණ සිට ගෝධාවරී තෙක් බලය ව්‍යාප්ත කිරීම.

ශිව සාතකර්ණී රජු

ශක බලය ඩෙකානයෙන් ඉවත් කිරීමට කටයුතු කිරීම

යඥ ශ්‍රී සාතකර්ණී රජු

- බටහිර ඉන්දියාවේ වෙරළබඩ ප්‍රදේශයේ ද නර්මදා නදී නිම්නයේ ද ඩෙකැනයේ ද මධ්‍ය හා

-නැහෙනහිර ප්‍රදේශවල ද බලය ගොඩනැඟීම

- මොහුගෙන් පසු සාතවාහන රාජ්‍ය කොටස්වලට බෙදී යාම

(iv) සාතවාහනයන්ගේ කලාව හා ගෘහ නිර්මාණ ශිල්පය පිළිබඳ විස්තර කරන්න

(ලකුණු 09 යි යි)

ගෘහනිර්මාණ ශිල්පය

- පිහිටිගල ඇතුළටහාරා චෛත්‍යය ශාලා (බුදුගෙය) හා විහාර (ආවාස ගෙය) ඉදිකිරීම.
- ඩෙකානයේ ඇති විශිෂ්ට වාස්තු විද්‍යාත්මක ලක්ෂණ පෙන්නුම් කරන ලෙන් කිහිපයක්

  භාජා, බෙද්සා, කාර්ලේ, ජුන්නාර්, නාසික්, කන්හේරි, අජන්තා (අංක 8,9,10,12,13 ලෙන්)

- මෙම ලෙන් බොහෝ විට බෞද්ධ භික්ෂූන්ට පූජා කර ඇත. එමෙන් ම බ්‍රාහ්මණයන් හා ජෛනයන් සඳහා ද ලෙන් පූජා කර ඇත.

- විහාර (ආවාස ගෙවල්) බොහෝ විට මධ්‍ය ශාලාවකින් ද දාන ශාලාවකින් හා කුඩා කුටි කිහිපයකින් ද සමන්විත ය.

- ඇතැම් ගුහාවල දානශාලාවල දන් වැළඳීම සඳහා දිග ගල් මේස නෙළා ඇත. උල්පත්වලින් ජලය ලැබෙන ගල් පොකුණු සකස් කර තිබේ. විහාර ඇතුළට ආලෝකය ලබා ගැනීමට ඇතුළු වන දොරටුවට කවුළුවක් තබා තිබීම.

- කාර්ලේ ලෙන මොවුන්ගේ විශිෂ්ටතම නිර්මාණය වීම. මෙහි විහාර බිත්ති පවා සියුම් කැටයමින් අලංකාර කොට ඇත. විහාරය ඇතුළට වන්නට පර්වතය හාරා කුඩා ස්තූපයක් නිමවා තිබේ.

<u>ස්තූප ඉදිකිරීම</u>

- අමරාවතී ස්තූපයටනව අංග එකතු කරමින් විශාල කිරීම රාශියක් ඉදි කිරීම
- සාංචි ස්ථූපයේ වාහල්කඩ කැටයමින් නිර්මාණය කිරීම
- අලුතෙන් ස්තූප රාශියක් ඉදි කිරීම

<u>මූර්ති හා චිත්‍ර කලාව</u>

- ලෙන් විහාරවල විවිධ චිත්‍ර හා මූර්ති දක්නට තිබීම
- බුද්ධ රූප චිත්‍රයට නැඹීම : අජන්තා අංක 10 ලෙන් විහාරය, නාගාර්ජුනකොණ්ඩ

  අජන්තා අංක 10 ලෙන් විහාර චිත්‍ර

- අජන්තා ලෙන්වල ඇති චිත්‍රවල බෞද්ධ කතාවස්තු හා බුද්ධ චරිතයේ ඇතැම් අවස්ථාවන් නිරූපණය කොට තිබීම. (විජය කුමාරයා ලංකාවට පැමිණීම චිත්‍රය)

- මෙම චිත්‍රවල රාජකීයයන්, කාන්තාවන්, තාපසයන්, කම්කරුවන්, යාචකයන්, ගොවියන්, විවිධ සතුන් හා වෘක්ෂලතා ආදිය නිරූපණය කොට තිබීම.
- නානාගාටිහි ලෙන්වල රජ පවුලේ සාමාජිකයන්ගේ පිළිම නෙලා තිබීම.

  උදාහරණ - සිමුඛ රජුගේ පිළිරුව, පළමු සාතකර්ණී රජුගේ පිළිරුව, නාගනිකා දේවියගේ පිළිරුව,

  පළමු සාතකර්ණී රජුගේ පුතුන් තිදෙනාගේ පිළිරූ

07.ගුප්ත අධිරාජ්‍යය සම්බන්ධව පහත දැක්වෙන තේමා යටතේ සාකච්ඡා කරන්න.

(i) ගුප්ත යුගයේ වාස්තු විද්‍යාත්මක නිර්මාණ

(ii) ගුප්ත ආර්ථිකය

(iii) ගුප්ත පරිහානිය (ලකුණු 16 යි)

(i) ගුප්ත යුගයේ වාස්තු විද්‍යාත්මක නිර්මාණ

වාස්තු විද්‍යාත්මක නිර්මාණ

■ පර්වත ඇතුළට කැණ ඒවායේ ලෙන් විහාර හා දේවාලය ඉදි කිරීමේ සම්ප්‍රදයේ දියුණුවීමක් සිදු වීම

■ මෙම ලෙන් විහාර දක්නට ලැබෙන ස්ථාන කිහිපයක්

උදාහරණ -අජන්තා, එල්ලෝරා, භාග්, අවුරංගාබාද්, උදයගිරි, දියෝගීර්, බිතර්ගෝන්

■ ලෙන් විහාර සම්ප්‍රදායයේ ප්‍රධාන ඉදි කිරීම් දෙකක් දක්නට ලැබේ.

- චෛත්‍ය ශාලා ක්‍රමය

- විහාර ශාලා ක්‍රමය- ආරාම හෙවත් විහාර ක්‍රමයට ලෙන ඉදි කිරීම

චෛත්‍ය ශාලා ක්‍රමය

- අජන්තාවේ ඇති ලෙන් 28න් 23ක් ම අයත් වන්නේ ගුප්ත යුගයටයි. මේවායින් අංක 19 හා 26 ලෙන් චෛත්‍යය ශාලා ය.

- සෘජුකෝණාස්‍රාකාර කුඩා ලෙන් වන මේවා චෛත්‍යයක් සහිත මධ්‍ය ශාලාවකින්ද දෙපස

සක්මන් කරන ශාලා දෙකකින් ද යුතු වේ.

- විශ්වකර්ම ගුහා ලෙස හැඳින්වෙන එල්ලෝරාවේ ඇති චෛත්‍යය ශාලාවක කුඩා චෛත්‍ය

වෙනුවට දක්නට ලැබෙන්නේ චෛත්‍ය ආසනය කොටගත් බුද්ධ ප්‍රතිමාවක

- බ්‍රාහ්මණයන් සඳහා කළ පැරණි ම ලෙන් වන්නේ උදයගිරි ලෙන් ය.

උදයගිරි ලෙන්

විහාර ශාලා ක්‍රමය

මේවා භික්ෂූන් වහන්සේලා වාසය කළ ආවාස ගෙවල් ය. අජන්තාවේ ඇති ලෙන් විහාර 21ක් අයත් වන්නේ මෙම වර්ගයට ය.

- මධ්‍ය ශාලාවක් හා දෙපස ආරාම කුටි සහිත ව මේවා නිමවා ඇත.

- ගුප්ත ගෘහනිර්මාණ ශිල්පය ආකාර දෙකකින් වර්ධනය වී ඇත.

1. පැරණි ක්‍රම හා සැලසුම් අනුකරණය නොකොට සෞන්දර්යයට මුල් තැන දෙමින් නවතාවකින් යුතු ගොඩනැඟිලි ඉදි කිරීම

2. ගොඩනැඟිලි ඉදිකිරීම සඳහා මෙතෙක් උපයෝගී කරගත් දැව වෙනුවට ගඩොළු හෝ ඔපමට්ටම් කළ කළුගල් හෝ යොදා ගැනීම

- පිහිටි ගලෙහි කළ ලෙන් විහාරවලට අමතරව දේවරූප තැන්පත් කිරීම සඳහා වෙන් ම විශේෂ ගොඩනැඟිලි ඉදි කිරීම

- ගොඩනැඟිලි සැලැස්ම හා හැඩය අනුව දළ වශයෙන් වර්ග 5කට බෙදා දැක්විය හැකි වීම

1. චතුරශ්‍රාකාර කුඩා ගර්භ ගෘහයක් තනා ඉදිරියට නෙරා සිටින පරිදි ද්වාර මණ්ඩපයක් ඉදි කළ ගොඩනැඟිලි

2. සතරැස් ගර්භ ගෘහය වටා ප්‍රදක්ෂිණ පථයක් ඉදි කිරීම

3. ඉහත සතරැස් කුඩා මන්දිරය මත කුඩා ශිඛරයක් ඉදි කිරීම

4. ආයතාකාර මන්දිර

5. සතරපසින් ද්වාර මණ්ඩප ඇති කවාකාර ව තැනූ ගොඩනැඟිලි

- නාගර හා ද්‍රාවිඩ යන ශෛලිය දෙකෙන්ම හින්දු දේවාලය නිර්මාණය වී තිබීම

උදාහරණ - දියෝගීර්හි දස අවතාර දේවාලය- බෞද්ධ ස්තූප නිර්මාණයහා ආරාම සංකීර්ණ නිර්මාණය ද මෙම යුගයේ දියුණුවක් ලැබී ය.

ආරාම සංකීර්ණ - බුද්ධගයා, නාලන්දා,

ස්තූප - සාරානාත් ධාමෙක්ස් ස්තූපය

(ii) ගුප්ත ආර්ථිකය

<u>කෘෂිකර්මාන්තය ප්‍රධාන ආර්ථික මාධ්‍යය වීම</u>

- වාරිමාර්ග ඉදි කිරීම- වී, තිරිඟු, බාර්ලී, මුං, කවුපි වගා කිරීම- කු`ඵ බඩු ද්‍රව්‍ය අධිරාජ්‍යයෙහි දකුණු පළාත්වල නිෂ්පාදනය කිරීම- ඉඩම් භුක්ති ක්‍රමය, අඳ ගොවි ක්‍රමය ක්‍රියාත්මක වීම

■ වෙළෙඳාම

- ගුප්ත අධිරාජ්‍යයේ ආර්ථිකය ශක්තිය වෙළෙඳාම මත පදනම් වීම.- වෙනත් රටවල් සමඟ පැවැති වෙළෙඳාම

රෝමය - රෙදි පිළී, සුවඳ විලවුන් හා සුඛෝපභෝගී භාණ්ඩ අපනයනය කිරීම

අග්නිදිග ආසියානු රාජ්‍ය සමඟ සබඳතා - ෆූනාන්, චෙන්ලා, චම්පා

- නිෂ්පාදනය, බෙදාහැරීම ශ්‍රේණි වශයෙන් සංවිධානය වී තිබීම.- වෙළෙඳ ශ්‍රේණි ප්‍රධානයා ජේතක නැතහොත් ප්‍රධාන අත්කම් ශිල්පියා ලෙස හැඳින්වූ අතරමෙය ප්‍රධාන තනතුරක් සේ සැලකීම

- <u>කර්මාන්ත</u>

- රෙදි පිළී නිෂ්පාදනය- උතුරු ඉන්දියාවේ පු`එල් ලෙස වර්ධනය වීම. සේද, කපු, ලෝම ආදි අමුද්‍රව්‍ය යොදාගනිමින් රෙදිපිළී නිෂ්පාදනය පිළිබඳ තොරතුරු හර්ෂ චරිතයේ, හියුංසාං, ඉත්සිංගේ වාර්තාවල සඳහන්වේ.

- ලෝම කර්මාන්තය- නැව් කර්මාන්තය

(iii) ගුප්ත පරිහානිය

- ස්කන්දගුප්ත රජුගෙන් පසු ගුප්ත අධිරාජ්‍යයේ පරිහානිය උදා වීම.

- ගුප්ත අධිරාජ්‍යයේ පරිහානියට හා බිඳ වැටීමට තුඩුදුන් හේතු සාධක රාශියක් ඇත.

- දුර්වල පාලකයන් බලයට පත් වීම
- රාජ්‍යය සඳහා ඇති වූ අභ්‍යන්තර අරගල
- ප්‍රදේශීය පාලකයන් හා සාමන්තයන් බලවත් වීම
- ආර්ථික වශයෙන් ඇති වූ පරිහානිය
- විදේශ ආක්‍රමණ

08.වෝල පරිපාලනයේ ප්‍රධාන ලක්ෂණ පහත මාතෘකා යටතේ පරීක්ෂා කරන්න.

(i) මධ්‍ය පාලනය

(ii) ප්‍රාදේශීය පාලනය

(iii) ග්‍රාම පාලනය (ලකුණු 16 යි)

(i) මධ්‍ය පාලනය

රජු වටා සංවිධානය වූ රාජාණ්ඩු පාලන රටාවක් පැවතීම

- සාමාන්‍ය සම්ප්‍රදායය අනුව රජුගේ අනුප්‍රාප්තිකයා මෙන් ම ප්‍රධාන සහායකයා වූ යුවරජතනතුරට රජුගේ වැඩිමහල් පුතු පත් කර ගැනීම- රජ දේවත්වයෙන් සැලකූ බව රාජකීයයන්ගේ මළ සිරුරු තැන්පත් කර දේවාල ඉදිකර පුද පූජා පැවැත්වීමෙන් තහවුරු වීම

- රජු සතුව පැවති බලතල ඒකාධිපති ස්වරූපයක් ගත්තත් පාලන රටාව තුළ ඒකාධිපතියකු ලෙස ක්‍රියා කළ නොහැකි වීම

- උදන්කුට්ටම් නැමති නිලධාරි මණ්ඩලයේ උපදෙස් අනුව රජු විසින් නීති පැනවීම සිදු කිරීම

- රජුගේ සහායට රාජ සභාවක් හෙවත් අමාත්‍ය මණ්ඩලයක් පැවති බව ඇතැම් මූලාශ්‍රයවල සඳහන් වීම

- එහෙත් ස්ථිර ඇමති මණ්ඩලයක් නොවූ බව රොමීලා තාපර් පෙන්වා දීම

- පෙරුන්දනම්- ඉහළ පෙලේ නිලධාරින්

- සිරුදනම් - පහළ මට්ටමේ නිලධාරින් ලෙස චෝල පාලනයට සම්බන්ධ නිලධාරින් බෙදිය හැකි වීම.

(ii) ප්‍රාදේශීය පාලනය

- ප්‍රදේශීය පාලනයේ දී චෝල අධිරාජ්‍ය මණ්ඩලම්වලට බෙදා පාලනය කිරීම

(චෝල, පාණ්ඩ්‍ය, ගංගා, වෙංගි, කේරළ, මුම්මුඩි චෝල)- චෝල ප්‍රතිරාජයකු යටතේ මෙම ප්‍රදේශීය මණ්ඩල පාලනය වීම

-වරායන් නිලධාරියා යටතේ යුද හා සිවිල් කටයුතුත්, අධිගාරිගල් නිලධාරියා යටතේ හමුදා කටයුතුත්

පවත්වාගෙන යාම- මුම්මුඩි චෝල මණ්ඩලයෙන් (ශ්‍රී ලංකාවේ චෝල ප්‍රදේශවලින්) ගෙනගිය බදු මුදල් පිළිබඳ වතංජෝරයේ මහා ශිව දේවාලය ලිපියේ සඳහන් වීම

(iii) ග්‍රාම පාලනය

ඌර්, වලනාඩු, නාඩු, කුරම් යනුවෙන් පාලන සභා බෙදී පැවතීම- ග්‍රාම පාලනයේ දී ඌර් සහ නාඩු යන ආයතන වඩාත් වැදගත් වීම- ඌර් සභාව තුළ ආලුන්ගනම් නම් වැඩිහිටි කණ්ඩායම ක්‍රියාකාරී පිරිස ලෙස වැදගත් වීම

- ඌර් සභාවේ නියෝජිතයන්ගෙන් වාරියම් සභා, ධර්ම සභා නමින් කමිටු පිහිටුවා තිබීම- වාරියම් කමිටුවලට ඇළවේලි සැකසීම, අලුතින් ගෙවතු අස්වැද්දීම, හා බදු අය කිරීම වැනි කටයුතුභාර වීම

- ධර්ම සභා කමිටුව මඟින් දේවාල හා කෝවිල් නඩත්තුව, අධ්‍යාපන මධ්‍යස්ථාන පවත්වාගෙන යාම හා ග්‍රාමීය සුභසාධන කටයුතු දියුණු කිරීම ආදිය සිදු කිරීම- අධිකරණ කමිටු මඟින් ගමේ නඩු විසඳීම සිදු කරන ලද අතර ඒ සඳහා වර්තමාන ජූරි ක්‍රමයට සමාන පංචායත් ක්‍රමය ක්‍රියාත්මක කිරීම

- චෝල ග්‍රාමීය පාලනයේ කුඩා ම ඒකකය කුරම් වූ අතර කුරම් ගණනාවක් එකතු වී නාඩු නම්

ඒකකය ද, නාඩු කීපයක් එකතු වී වලනාඩු නම් ඒකකය ද ගොඩනැඟී තිබීම

- චෝල ග්‍රාම පාලනය ප්‍රජාතන්ත්‍රවාදී පාලන ලක්ෂණවලින් සමන්විත වීම.

09.පහත මාතෘකා අතුරින් ඕනෑම **දෙකක** ඓතිහාසික වැදගත්කම පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(i) සමුද්‍රගුප්ත රජුගේ යුධ ප්‍රයාණ

(ii) පුෂ්‍යභූති රාජවංසය

(iii) ධර්මපාල රජු

(iv) පාණ්ඩ්‍ය රාජධානිය (ලකුණු 8x 2 =16 යි)

(i) සමුද්‍රගුප් රජුගේ යුධ ප්‍රයාණ

සමුද්‍රගුප්ත රජු (ක්‍රි.ව 335- 376)

■ මොහු පිළිබඳ ව හැදෑරීමට ඇති ප්‍රධානතම ලේඛනය හරිසේනගේ අලහබාද් ප්‍රශස්තිය යි. මීට අමතර ව එරාන සහ ගයා යන ස්ථාන දෙකේ, ප්‍රධාන සෙල්ලිපි දෙකක් පිහිටුවා ඇත.

■ අලහබාද් ප්‍රශස්තියට අනුව චන්ද්‍රගුප්ත රජු විසින් සිය පුත්‍ර සමුද්‍රගුප්තයන්ට රාජ්‍ය භාර දීම

■ සමුද්‍ර ගුප්ත රජුගේ බල ව්‍යාප්තිය අදියර හතරක් යටතේ සිදු විය.

-ආර්යාවර්තය ජය ගැනීම

- අටවික රාජ්‍ය ජය ගැනීම

-දක්ෂිණාපථය ජය ගැනීම

- දේශසීමාබද රාජ්‍ය ජය ගැනීම

■ අලහබාද් ප්‍රශස්තියට අනුව පැහැදිලි වන්නේ සමුද්‍රගුප්ත රජ වන විට ගුප්ත රාජ්‍ය ප්‍රදේශීය බලයක් පමණක් හිමි කරගෙන සිටි බව ය.

■ පාටලීපුත්‍රය අගනගරය කරගනිමින් දිග් විජය ප්‍රතිපත්තියක් අනුගමනය කළ සමුද්‍රගුප්ත රජු ඇසෑමය, බෙංගාලය, පංජාබය, ඩෙකානය පසු කරමින් කාංචිය තෙක් මාල්වා, කතියවාර් දක්වා ද සිය බලය ව්‍යාප්ත කළේ ය.

■ නිශ්චිත ප්‍රදේශයක් පමණක් පාටලීපුත්‍රයේ සිට පාලනය කරමින් සෙසු අසල්වැසි රාජ්‍යයන් පුද පඬුරු හා දූත ගමන් මඟින් අවනත කරවා ගත්තේ ය.

සමුද්‍රගුප්ත අධිරාජයාගේ දිග් විජය ප්‍රතිපත්තිය

■ ආර්යාවර්තයේ රජවරුන් 9 දෙනෙකු යටත් කිරීම

■ වින්ධ්‍යාවෙන් හා නර්මදා නදියෙන් දකුණේ දක්ෂිණාපථයට ආක්‍රමණ දියත් කොට පාලකයන් දොළොස් දෙනෙකු යටත් කොටගෙන ඇත. එම ප්‍රදේශ හා පාලකයන් මෙසේ දැක්විය හැකි ය.

■ ප්‍රත්‍යන්ත රාජ්‍ය නවයක් යටත් කර ගැනීම

■ මෙම රාජ්‍ය කුඩා ගෝත්‍රික රාජ්‍ය ලෙස සැලකේ. ගණ රාජ්‍ය 09ක් යටත් කර ගැනීම

-මාලව, අර්ජුනායන, යෞධේය, මාද්‍රක, ආභීර, ප්‍රාර්ජුන, ගණකාහික, කාක, කරපරික- අලහබාද් ප්‍රශස්තියට අනුව දැක්වෙන ආකාරයට බටහිර ඉන්දියාවේ හා දකුණු ඉන්දියාවේසමුද්‍රගුප්ත රජුට සේවය කළ ස්වාධීන රාජ්‍යය කිහිපයක් පැවතීම.

-අශ්වමේධ යාගය පවත්වන කාසි- අශ්වමේධ යාග දෙකක් පැවැත්වූ බව සඳහන් වීම ප්‍රශස්තිකරුවා රජුට සටන් සියයක වීරයායන අභිධානය ලබා දී තිබීම- අධිරාජයා නිකුත් කළ විවිධ කාසි ඔහුගේ රණකාමීත්වය, ඔහු ගොඩනැඟූ දේශපාලනආධිපත්‍යය පමණක් නොව එවක පැවැති ආර්ථික සමෘද්ධිය විදහා දක්වයි.

- සමුද්‍රගුප්ත ශාස්ත්‍රයෙහි මනා නිපුණයෙක් විය. ප්‍රශස්තිකරුවා කවිරාජ් යන විරුදයෙන් මොහු

හඳුන්වා ඇත්තේ එනිසා ය.

- රජුගේ එක් කාසියක රජු වීණාවක් අතින් ගෙන සිටින ආකාරය දක්වා ඇත.

(ii) පුෂ්‍යභූති රාජවංසය

පුෂ්‍යභූති පරපුරේ ප්‍රභාකරවර්ධන කනෞජය බලවත් කිරීමට පදනම දැමීම

- ඔහු මාල්වා දේශය ජය ගෙන පරම භට්ටාරක මහාරාජාධිරාජ විරුදය ලබා ගැනීම

- මිහිරකුල නම් හූණ ආක්‍රමණිකයා හා ගෞඩදේශය සමඟ සටන් කිරීම

- මෞඛරී වාංශික ග්‍රහවර්මන්ට සිය දියණි වන රාජ ශ්‍රී විවාහ කර දීම

- මෙමගින් ථානේශ්වරය හා කනෞජය එක්සත් වීම

- ථානේශ්වරය කේන්ද්‍ර කර පුෂ්‍යභූති රාජවංශය බලවත් වීම

■ හර්ෂවර්ධන රජු

මූලාශ්‍රය - බානභට්ටගේ හර්ෂ චරිතය, හියුංසාං වාර්තාව- දේශපාලන කටයුතු

- වලභි හා ගුර්ජර පාලකයන් සමඟ සටන් කිරීම

- වාතාපියේ බටහිර චාලුක්‍යයන් සමඟ සටන් කිරීම

- සින්දු ප්‍රදේශය සමඟ සටන් කිරීම

- නැඟෙනහිර ඉන්දියාවේ අවුද්, කොංගෝද රාජ්‍ය සමඟ සටන් කිරීම

- ගුප්ත යුගයෙන් පසු උතුරු ඉන්දියාව එක්සත් කළ අවසන් පාලකයා වීම

- කනෞජය මුල් කොට පාලනය මෙහෙයවීම

- සකල උත්තරාපතනාථ යන නාමයෙන් හර්ෂ රජු, සිය සතුරා වන දෙවන පුලකේශීන් සිය

අයිහෝල් අභිලේඛනයේ හඳුන්වා ඇත.

- සංවිධානාත්මක රාජ්‍ය පරිපාලන තන්ත්‍රයක් ගොඩනැඟීම

-චීනයත් සමග සම්බන්ධතා පැවැත්වීම- විශාල වැඩ කොටසක් කළ පාලකයකු වුවත් මූලාශ්‍රය හිඟකම නිසා ඉතිහාසය තුළ ඔහුට නිවැරදි

තක්සෙරුවක් ලැබී නැත.- ආගමික, සාහිත්‍යය හා අධ්‍යාපන සේවා

- ආගමික සහනශීලී ප්‍රතිපත්තිය

-කනෞජ් හා ප්‍රයාග ආගමික සම්මේලන පැවැත්වීම

- පංච වාර්ෂික මහා දානයක් පිරිනැමීම

- ස්තූප හා විහාර ගොඩනැංවීම

- බුද්ධිමතුන්ට අනුග්‍රහ දැක්වීම

- රාජ්‍ය ආදායමෙන් 1/4ක් ලේඛකයන්ට පිරිනැමීම

- නාලන්දා, තක්ෂිලා, වලභි වැනි අධ්‍යාපන මධ්‍යස්ථානවලට අනුග්‍රහ දැක්වීම

- රජුද ග්‍රන්ථකරණයේ නියැළීම (රත්නාවලී, ප්‍රියදර්ශිකා, නාගානන්ද)

- රජුගේ අනුග්‍රහය නිසා විද්වතුන් විසින් සාහිත්‍යය කෘති රචනා කිරීම

උදාහරණ : බාණ - හර්ෂ චරිතය, කාදම්බරී, චණ්ඩි හතකය, පාර්වතී පරිණය,

- සූර්ය ශතක

- හර්ෂ චරිතයේ හර්ෂ රජ වීම තෙක් විස්තර ඇති හර්ෂ රජ වීමෙන් කෘතිය අවසන් වේ.

(iii) ධර්මපාල රජු

-ඉන්දියාවේ අවසන් බෞද්ධ අධිරාජ්‍යය පාල රාජවංසය වේ.

-සසංක රජුගේ ඇවෑමෙන් දුර්වල වූ බෙංගාලයේ පාල වාංශික ගෝපාල බලය පිහිටුවීම

-ධර්මපාල රජු විසින් පාල වංශය යටතේ උතුරු ඉන්දියාවේ රාජ්‍යයක් ගොඩනැඟීම- ධර්මපාල රජු පරමේශ්වර, පරම භට්ටාරක, හා මහා රාජාධිරාජ යන විරුදාවලින් හැඳින්වීම

-දේවපාල රජු යටතේ තව දුරටත් අධිරාජ්‍යය ව්‍යාප්ත වීම- පළමු වන මහීපාල, රාජේන්ද්‍ර චෝල හමුවේ පරාජයට පත් වීමත් සමඟ පාල රාජ්‍යයේ අවසානය සිදු වීම

- කෙසේ වෙතත් මෙම පාලකයන් විසින් සංස්කෘතික සේවාවන් රැසක් සිදු කිරීම- පාල රජවරුන් බුදු දහමට ප්‍රබල අනුග්‍රහයක් දැක්වීම

- ගෝපාල රජු නාලන්දාවේ විහාරයක් ඉදි කිරීම- වික්‍රමශිලා, ඕදන්තපුරී ඇතුළු බෞද්ධ අධ්‍යාපන ආයතන 50කට වැඩි සංඛ්‍යාවක් පිහිටුවීම

-අටිස නම් භික්ෂුව ටිබෙටයට ධර්ම දූත මෙහෙවරට යැවීම

-අග්නිදිග ආසියාවේ ශ්‍රීවිජය අධිරාජ්‍යය සමඟ බෞද්ධ සම්බන්ධතා පැවැත්වීම

- මෙලෙස මහායාන බුදු දහමේ ප්‍රබෝධය ටිබෙටයේ හා ගිනිකොනදිග ආසියාවේ ප්‍රචලිත වීම

- ධර්මපාල රජු නාලන්දා විහාරයට ගම්වර පූජා කිරීම

-කලා ශිල්පයන්හි වර්ධනය

- පාලයන්ගේ කැටයම් හා මූර්ති ශිල්පය ශ්‍රී ලංකාව, නේපාලය, තිබ්බතය, බුරුමය, ඉන්දු චීනය හා ඉන්දුනිසියා යන රටවල කලා ශිල්ප කෙරෙහි බලපෑම

- සංස්කෘත සාහිත්‍යයේ දියුණුව- බෙංගාලි භාෂාවේ සම්භවය

- භාවදේවහට්ට, මුතවාහන වැනි පඬිවරුන් බිහි වීම- හින්දු ආගමට අනුග්‍රහ දක්වමින් දේවාලය ඉදි කිරීම

(iv) පාණ්ඩ්‍ය රාජධානිය

- පාණ්ඩ්‍ය රාජ්‍යයේ ඉතිහාසය ප්‍රධාන අවධි දෙකකින් යුක්ත වීම

පළමුවෙනි පාණ්ඩ්‍ය අධිරාජ්‍ය -(ක්‍රි.ව 670 - 920)

දෙවෙනි පාණ්ඩ්‍ය අධිරාජ්‍ය -(ක්‍රි.ව 1210 - 1310)

පළමුවෙනි පාණ්ඩ්‍ය අධිරාජ්‍යය

-වර්තමාන මධුරෙයි, රාමනදි හා තින්නවේලි දිස්ත්‍රික්ක ද, ට්‍රවැන්කෝර් ප්‍රදේශයේ දකුණු කොටස ද

අයත් වීම

- අගනුවර මධුරාපුරය වීම- ආරම්භක පාලකයා කඩුන්ගෝන් නැමැත්තකු වීම- අනතුරු ව මාරවර්මන් අවනිශූලාමනී, ශෙන්දන්, අරිකේශරි මාරවර්මන් කොච්චඩයියන් (රණධීර)

පළමුවෙනි රාජසිංහ මාරවර්මන් යන පාලකයන් බලයට පත් වීම

පළමුවෙනි වරගුණ මහාරාජ (ජටිල පරාන්තක)- පාණ්ඩ්‍ය රාජ්‍යය අධිරාජ්‍ය තත්ත්වයට ගෙන ඒමට පදනම දැමීම- රාජ්‍යය තංජෝර් හා කොයිම්බතෝර් ප්‍රදේශවලට පැතිරීම

Past Papers Wiki

ශ්‍රී මාර ශ්‍රී වල්ලභ

- ගංගා, පල්ලව, චෝල කාලිංග යන පාණ්ඩ්‍ය රාජ්‍යය අවට පිහිටි රාජ්‍යයන් හතරක් ජය ගැනීම- පරවක්‍ර කෝලහාල (සතුරු පිරිස් වික්ෂිප්තියට පමුණුවන්නා) යන විරුදාවලිය භාවිත කරමින්

ගෙනගිය යුද්ධය නිසා සමීප රාජ්‍යයන් සතුරු වීම- ඔහුට එරෙහි ව පැමිණි ගංග, පල්ලව චෝල හා කාලිංග යන රටවල පාලකයින්ගෙන් සැදුම්ලත්

සතුරු සන්ධානයක් ‘ කුම්බකෝණම් ’ හි දී පරාජයට පත් කිරීම

- දකුණු ඉන්දියාවෙන් බැහැරට බලය ව්‍යාප්ත කරමින් පළමුවෙනි සේන රාජ්‍ය සමයේ දී ලංකාවආක්‍රමණය කිරීම

- ක්‍රි.ව 850 දී නෘපතුංග නම් පල්ලව රජු අරිශිල් නදිය අසල කළ සටනේ දී ශ්‍රී මාර පරාජයට පත් කිරීම- අරිශිල් සටන පැවතිය ද ලංකාවේ දෙවෙනි සේන රජු වෙනත් පාණ්ඩ්‍ය කුමරයකුගේ සහයටයැවූ සේනාවන් මදුරාපුරය විනාශ කර ශ්‍රී වල්ලභ රජුට මරණීය තුවාල සිදු කිරීම

දෙවෙනි වරගුණවර්මන්

- රාජ්‍යය ලබා ගැනීමට ශ්‍රී ලංකාවේ දෙවන සේන රජුගේ සහාය ලබාගැනීම- නැවත පාණ්ඩ්‍ය බලය ගොඩනැඟීමට උත්සාහ ගත්තත් පල්ලව, චෝල හා ගංග රාජ්‍යයන් ඒකාබද්ධව එල්ල කළ ශ්‍රී පුරුම්බියම් සටනෙන් බලය බිඳ වැටීම

දෙවෙනි රාජසිංහ මාරවර්මන්

- නැගී එන චෝල බලය වර්ධනයට ශ්‍රී ලංකාවේ පාලකයන්ගෙන් සහාය ලබා ගැනීම- පස්වෙනි කාශ්‍යප රජු ඔහු පුත් සක්ක සේනාපති යටතේ සිංහල සේනාවක් ලබා දීම

- සිංහල, පාණ්ඩ්‍ය ඒකාබද්ද හමුදා පළමුවන පරන්තක චෝල අධිරාජයා අතින් පරාජයට පත්වීම

- පාණ්ඩ්‍ය රජු රාජ කතුධ භාණ්ඩ රැගෙන ජීවිතාරක්ෂාව පතා ලංකාවට පළා යාම

- පාණ්ඩ්‍ය දේශය 10 වන සියවස අවසානයේදි චෝල ආධිපත්‍යයට නතු වීම

- මින් පසු සියවස් දෙකක් පමණ යන තෙක් පාණ්ඩ්‍ය රාජ්‍යය චෝල අධිරාජ්‍යයේ ප්‍රාන්තයක් ලෙස පැවතීම

දෙවෙනි පාණ්ඩ්‍ය අධිරාජ්‍යය

- දොළොස්වන සියවසේදි චෝල සිහසුන උදෙසා ඇති වූ සිවිල් අරගල හේතුවෙන් යළි පාණ්ඩයින්ට බලය හිමි වීම- ජටාවර්මන් කුලසේකර පාණ්ඩ්‍ය බලය යළි නැංවීමට මුල් වීම

- අනතුරු ව බලයට පත් මාරවර්මන් සුන්දර පාණ්ඩ්‍ය චෝල රාජ්‍යය ආක්‍රමණය කොට තංජෝර් නගරය කොල්ල කා එහිම අභිෂේක වීම

සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

ජටාවර්මන් සුන්දර පාණ්ඩ්‍ය

- ක්‍රි.ව 1251 බලයට පත් මොහු දෙවන පාණ්ඩ්‍ය අධිරාජ්‍යයේ ශ්‍රේෂ්ඨමයා වීම- පාණ්ඩ්‍ය රාජ්‍යය වෙනත් ප්‍රදේශවලට ව්‍යාප්ත කිරීම

- හොයිසාලවරුන්ගේ මයිසූර් ප්‍රදේශය සීමා කර කේරල හා චෝල පාලකයන් තමාට අවනත කර ගැනීම

-ශ්‍රී ලංකාවේ චන්ද්‍රභානු රජු පන්නා දැමීමට සිංහල පාලකයන්ට උදව් කිරීම

- සේන්ඩ මංගලම් නැමති බලකොටුවට පහරදීම

-පල්ලවයන්ගේ කාංචිය ආක්‍රමණ කර නගරය අත්පත් කර ගැනීම

- ආක්‍රමණවලින් ලබාගත් ධනය අගමික සිද්ධස්ථාන ගොඩනැඟීමට හා නඩත්තුවට ලබා දීම

පළමුවෙනි මාරවර්මන් කුලශේකර

- දිග්විජය ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම- ඔහුගෙන් පසු සිවිල් අරගල ඇති වීම නිසා රාජ්‍යය දුර්වල වීම

- දිල්ලි සුල්තාන් රාජ්‍යයේ නැඟී ඒම සහ විජයනගර් රාජ්‍යයේ බලවත් වීම නිසා දෙවෙනි පාණ්ඩ්‍ය අධිරාජ්‍යය බිඳවැටීම

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Paper Bank